# තුන්වැනි කොටස

## තුන්වන කොටස

## මුදල් මණ්ඩලය විසින් 1996 වර්ෂයේදී උපයෝගී කරගනු ලැබූ ප්‍රධාන පරිපාලන විධිවිධාන

**මෙහෙයුම් උපදෙස්** **පිටුව**


1. ජාත්‍යන්තර සංවර්ධන සංගමය. ණය 2310 සීඊ දෙවන කෘෂිකාර්මික කටයුතු ව්‍යාප්ති ව්‍යාපෘතිය - මෙහෙයුම් උපදෙස් අංක ඩීඩී / 2/ 96 i

2. ආනයන සඳහා ක්‍රියාපිළිවෙල - ආ. සං. බැ. ණය අංක 1204 ශ්‍රී (එස්එෆ් ) නාගරික සංවර්ධන අංශ ව්‍යාපෘතිය - මෙහෙයුම් උපදෙස් අංක ඩීඩී / 3/ 96. iii

3. ජාත්‍යන්තර සංවර්ධන සංගමය. 1698 සීඊ - දෙවන වෘත්තිය පුහුණු ව්‍යාපෘතිය. මෙහෙයුම් උපදෙස් අංක ඩීඩී / 4/ 96. v

4. යෙන් 71, 148,000/- ජපන් / ශ්‍රී ලංකා විශේෂ ප්‍රදානය (22 වැනි ණය සහන ප්‍රදානය) මෙහෙයුම් උපදෙස් අංක ඩීඩී/ 5/ 96. vi

5. ජාත්‍යන්තර සංවර්ධන සංගමය 2249 සීඊ - දෙවන විදුලි සංදේශ ව්‍යාපෘතිය. මෙහෙයුම් උපදෙස් අංක ඩීඩී /6/ 96. viii

6. ඇමෙරිකානු එක්සත් ජනපද ඩොලර් දශලක්ෂ 15ක් සඳහා වන ඉන්දු ශ්‍රී ලංකා ණය ගිවිසුම. - ආනයන සඳහා ගෙවීමේ ක්‍රියාමාර්ගය - මෙහෙයුම් උපදෙස් අංක ඩීඩී/ 7/ 96. x

7. ආනයන සඳහා ක්‍රියා පිළිවෙළ - ආ. සං. බැ. ණය අංක 1414 ශ්‍රී (එස්එෆ්) විදුලිබල පද්ධතිය පුළුල් කිරීමේ දෙවන ව්‍යාපෘතිය - මෙහෙයුම් උපදෙස් අංක ඩීඩී / 08/ 96. xiii


**චක්‍රලේඛ**


8. වාණිජ බැංකුවලින් විදේශීය ව්‍යවහාර මුදල් මිලදී ගැනීම සඳහා මහ බැංකුවේ අනුපාතිකයන්. 1996 xv

බැංකු කටයුතු දෙපාර්තමේන්තුව,
විදේශ මුදල් අංශය.
1996 ජනවාරි 23 වැනි දින.

මෙහෙයුම් උපදෙස් අංක බීඩී/2/96

කළමනාකරු,
අගනුවර ශාඛාව - ආනයන දෙපාර්තමේන්තුව,
ලංකා බැංකුව,
යෝර්ක් වීදිය,
කොළඹ 01.

මහත්මයාණෙනි,

## ජා. සං. සං. ණය 2380 සීර් දෙවන කෘෂිකාර්මික කටයුතු ව්‍යාප්ති ව්‍යාපෘතිය

ලෝක බැංකුවේ ජාත්‍යන්තර සංවර්ධන සංගමය මගින් ශ්‍රී ලංකාවට ප්‍රදානය කරන ලද උක්ත ණය යටතේ කරනු ලබන ආනයන සම්බන්ධයෙන් අනුගමනය කළයුතු ක්‍රියා පිළිවෙත පහත දැක්වේ.

1. කොළඹ 7, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවතෙහි අංක 42, කෘෂිකර්ම, ඉඩම් හා වන සම්පත් අමාත්‍යාංශයෙහි දෙවන කෘෂිකාර්මික කටයුතු ව්‍යාප්ති ව්‍යාපෘතියෙහි ව්‍යාපෘති අධ්‍යක්ෂ වෙනුවෙන් ඔබගේ බැංකුව විසින් ස්ථාපිත කරන ලද සහතික කළ, අවලංගු කළ නොහැකි, ආධිනතාවයක් නොමැති ණයවර ලිපි මගින් ආනයනයන් සිදුකළ යුතුවේ.

2. ඔබගේ ණයවර ලිපි ආරම්භ කිරීම සඳහා ඔබට බලය පැවරෙන්නේ විදේශ සම්පත් අධ්‍යක්ෂ ජනරාල් විසින් "ජා. සං. සං. 2380 සීර් - දෙවන කෘෂිකාර්මික කටයුතු ව්‍යාප්ති ව්‍යාපෘතිය " නමින් නිකුත් කරනු ලබන ප්‍රතිපාදන ලිපිය මගිනි.

3. මා විසින් වෙනත් උපදෙසක් දී නොමැත්තේ නම් ඔබ විසින් විවෘත කරනු ලබන සෑම ණයවර ලිපියකම ජා. සං. සං. වෙතින් ගණුදෙනුකාර බැංකුව වෙත ප්‍රතිපූරණය ලැබෙනු ඇති බවටත් ණයවර ලිපිය වලංගුවනුයේ ජා. සං. සං. විසින් ගණුදෙනුකාර බැංකුව වෙත සිය විශේෂ බැඳුම්කරය නිකුත්කළ විට පමණක් බවටත් කොන්දේසියක් අඩංගු විය යුතුය.

4. ජා. සං. සං. වෙත විශේෂ බැඳුම්කරයක් සඳහා ඔබ ගණුදෙනුකරු විසින් අයදුම් කිරීම 1931 පෝරමය (උද්ධෘතයක් අමුණා ඇත) මගින් කළ යුතු වන අතර එය පහත දැක්වෙන ලියකියවිලි මගින් තහවුරු විය යුතුය.

   (අ) ගෙවීමට අදාළ කොන්ත්‍රාත්තුවෙහි හෝ මිළදී ගැණුම් අණකරයෙහි පිටපතක් සහ
   (ආ) ඔබ බැංකුව විසින් නිකුත් කිරීමට යෝජනා කරන ණයවර ලිපියෙහි පිටපත් දෙකක්

5. සෑම ණයවර ලිපියක් සඳහාම කරනු ලැබූ සියළුම සංශෝධනයන්ගේ අනුපිටපත් ජා. සං. සං. ට සැපයීමට ගණුදෙනු කරන බැංකුවට උපදෙස් දිය යුතුය. ජා. සං. සං. විසින් පහත දැක්වෙන සංශෝධනයන් සඳහා එහි ලිඛිත අනුමැතිය සපයනු ඇත.

   (අ) ණයවර ලිපියෙහි වටිනාකම
   (ආ) භාණ්ඩවල ප්‍රමාණය හෝ භාණ්ඩ පිළිබඳ විස්තරය
   (ඇ) ප්‍රතිලාභියා සහ
   (ඈ) ණයවර ලිපියෙහි කල්ඉකුත්වන දිනය, මුලින් සඳහන් කරන ලද දිනය හෝ ජා. සං. සං. විසින් නිකුත් කරන ලද විශේෂ බැඳුම්කරයෙහි සඳහන් දිනය හය මසක් ඉක්මවා දීර්ඝ කිරීමක්.

   වෙනත් කිසිදු සංශෝධනයක් සඳහා ජා. සං. සං. හි පූර්ව අනුමැතිය අවශ්‍ය නොවේ.

6. උක්ත ණය මාලාව විශේෂ ගැණුම් හිමිකම් මගින් ප්‍රකාශිත බැවින් වෙනත් ව්‍යවහාර මුදල් වර්ගයකින් ප්‍රකාශිත ණයවර ලිපියක් සම්බන්ධයෙන් ජාත්‍යන්තර සංවර්ධන සංගමය විශේෂ බැඳුම්කර ලිපිය නිකුත් කිරීමේදී සිය බැඳීම විශේෂ ගැණුම් හිමිකම් මගින් දක්වනු ඇත. මෙම සීමාකරණය හේතුකොටගෙන ජා. සං. සං. මගින් ණයවර ලිපියෙහි සඳහන් මුළු විදේශ මුදල් ප්‍රමාණය විදේශයෙහි සිටින ඔබ නියෝජිතයාට ප්‍රතිපූරණය කරනු නොලබන්නේ නම් මේ සම්බන්ධයෙන් විනිමය පාලක විසින් ඔබ වෙත නිකුත් කරන ලද උපදෙස්වලට අනුකූලව ගණුදෙනු කරනු ලබන බැංකුව වෙත අයවිය යුතු ශේෂය ඔබ විසින් ගෙවිය හැකිය.

7. මෙම ණය ක්‍රමය යටතේ ආනයනකරුවන් නාවික ලියකියවිලි සඳහා වන ලේඛනයන්හි රුපියල් වටිනාකම රජයේ ප්‍රතිපාර්ශවීය අරමුදල් ගිණුමට ගෙවීමට අවශ්‍ය නොවේ. එබැවින් ඔබ වෙත හෝ ඔබ ගණුදෙනු කරන බැංකුව වෙත අයවිය යුතු කොමිස්, අය කිරීම් ආදිය වේ නම් ඒවා අයකර ගැනීමෙන් පසු එම ලියකියවිලි ඔබට ලැබුණු වහාම ඔබ ගණුදෙනුකරුවන් වෙත මුදා හැරිය යුතුය.

8. ණයවර ලිපි හා සංශෝධන කිසිවක් වේ නම් ඒවායෙහි පිටපත් කොළඹ, ශ්‍රී ලංකා මහ බැංකුවෙහි ප්‍රධාන ගණකාධිකාරී ගේ දැන ගැනීම පිණිස ඉදිරිපත් කළ යුතුය.

9. මේ සම්බන්ධයෙන් සිය අවශ්‍යතා පිළිබඳව විනිමය පාලක විසින් ඔබ වෙත වෙනම උපදෙස් සපයනු ඇත.

ඔබේ,
විශ්වාසී,

**ඒ. ෂන්මුගසාමි.**
*අතිරේක ප්‍රධාන ගණකාධිකාරී.*

පිටපත් :-

1. විනිමය පාලක

2. පී. ඒ. ගුණතිලක මහතා,
වයාපෘති කළමණාකරු,
දෙවැනි කෘෂිකාර්මික ව්‍යාප්ති ව්‍යාපෘතිය,
කෘෂිකර්ම, ඉඩම් සහ වන සම්පත් අමාත්‍යාංශය,
42, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත,
කොළඹ - 07.

බැංකු කටයුතු දෙපාර්තමේන්තුව,
1996 පෙබරවාරි මස 23 වැනි දින.

මෙහෙයුම් උපදෙස් අංක: බීඩී/03/96

කළමණාකරු (ආයතන ශාඛාව),
ආනයන දෙපාර්තමේන්තුව,
ලංකා බැංකුව,
කොළඹ - 01.

මහත්මයාණෙනි,

## ආනයන සඳහා ක්‍රියාපිළිවෙල - ආ. සං. බැ. ණය අංක 1204 ශ්‍රී (එස්එප්)

## නාගරික සංවර්ධන අංශ ව්‍යාපෘතිය

ආසියානු සංවර්ධන බැංකුව (මින් ඉදිරියට ආ. සං. බැ. යනුවෙන් හැඳින් වේ.) නාගරික සංවර්ධන අංශ ව්‍යාපෘතිය වෙනුවෙන් ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජන රජයට විශෙෂ 19,204,000.00 කට සමාන ණය ප්‍රමාණයක් ලබා දීමට එකඟ වී ඇත. මෙම ව්‍යාපෘතිය නාගරික සංවර්ධන අධිකාරිය (මින් ඉදිරියට නා. සං. අ. යනුවෙන් හැඳින්වේ.) මගින් ක්‍රියාත්මක කෙරේ. ණය මුදලින් කොටසක් නා. සං. අ. මගින් ව්‍යාපෘතිය සඳහා උපකරණ ආනයනය කිරීමට යොදවනු ඇත. මෙම ව්‍යාපෘතිය යටතේ කරනු ලබන ආනයන සම්බන්ධයෙන් ඔබ විසින් පහත සඳහන් ක්‍රියාපිළිවෙල අනුව කටයුතු කිරීම අවශ්‍ය වේ.

2. සුදුසුකම් ලැබූ මූලාශ්‍ර රට වලින් කළයුතු සියළුම ආනයන නා. සං. අ. යේ ඉල්ලීම මත ඔබ විසින් ආරම්භ කරන ලද සහතික කරන ලද අවලංගු කළ නොහැකි, ආධීනතාවක් නොමැති ණයවර ලිපි මගින් කළ යුතුය. මෙවැනි සෑම ණයවර ලිපියකම පහත සඳහන් වගන්තිය ඇතුලත් විය යුතුය.

> “ මෙම ණයවර ලිපිය ආසියානු සංවර්ධන බැංකුවෙහි ණය අංක 1204 එස්ආර්අයි (එස්එප්) යටතේ ආරම්භ කරනු ලැබ ඇති අතර මෙය ක්‍රියාත්මක වනුයේ ආසියානු සංවර්ධන බැංකුව සිය බැඳුම්කර ලිපිය, දැනුම් දෙන /සහතික කරන බැංකුවට නිකුත් කළහොත් හා නිකුත් කළ විට පමණි. ගෙවීම් සඳහා මෙකී බැඳුම්කර ලිපියෙහි ඇතුළත් උපදෙස් කරුණාකර පිළිපදිනු මැනවි. ”

ණයවර ලිපියෙහි ඉහත සඳහන් වගන්තිය ඇතුළත් නොවූ විට පවා ගණුදෙනුව මූල්‍යකරණය කිරීමට ඔබ විසින් භාරගන්නේ නම් එය වහා ක්‍රියාත්මක තත්ත්වයට පත්වේ . කෙසේ වුවද, ආ. සං. බැ. වෙහි බැඳුම්කරය නිකුත් කළහොත් හා නිකුත් කළ විට මූල්‍යමය බැඳීම් ආ.සං. බැ. වෙත පැවරෙනු ඇත. මෙවැනි අවස්ථාවක ණයවර ලිපියෙහි පහත සඳහන් වගන්තිය ඇතුළත් විය යුතුය.

> “ මෙම ණයවර ලිපිය මූල්‍යකරණය ශ්‍රී ලංකාවෙහි කොළඹ, ලංකා බැංකුව විසින් භාරගනු ලැබ ඇත. කෙසේ වුවද, මෙය ආසියානු සංවර්ධන බැංකුවෙහි ණය අංක 1204 එස්ආර්අයි (එස්එප්) යටතේ විවෘත කර ඇති අතර දැනුම් දෙන/ සහතික කරන බැංකුවට ආසියානු සංවර්ධන බැංකුව විසින් බැඳුම්කර ලිපිය නිකුත් කළහොත් හා නිකුත් කළ විට එකී ණයවර ලිපිය සම්බන්ධයෙන් මෙම බැඳුම්කර ලිපියෙහි ඇතුළත් උපදෙස් අනුව ක්‍රියාකොට ආසියානු සංවර්ධන බැංකුවෙන් ගෙවීම / ප්‍රතිපූරණය සඳහා හිමිකම් පෑ යුතුය. ”

ඔබගේ ණයවර ලිපියෙහි පිටපත් දෙකක් නා. සං. අ. වෙත යැවිය යුතු වන අතර එවිට නා. සං. අ. විසින් ආ. සං. බැ. විසින්, නිකුත් කරනු ලබන සාමාන්‍ය බැඳුම්කර ලිපිය ඔබගේ නියෝජිතයා වෙත යැවීමට කටයුතු සලසනු ඇත. නා. සං. අ. හි ඉල්ලීමට ආ.සං. බැ. එකඟ වුවහොත් ආ. සං. බැ. විසින් මෙම ලිපියෙහි ඇමුණුම් 1හි සඳහන් අන්දමට සිය සාමාන්‍ය බැඳුම්කර ලිපිය නම් කර ඇති වාණිජ බැංකුව වෙත නිකුත් කරනු ඇත.

3. (i) ණයවර ලිපියෙහි පහත දැක්වෙන කිනම් සංශෝධනයක් සඳහා වුවද ආ. සං. බැ. හි ලිඛිත අනුමැතිය අවශ්‍ය වේ.

(අ) ණයවර ලිපියෙහි වටිනාකම හා අදාළ ව්‍යවහාර මුදල් ඒකකය ඇතුලු ගෙවීම් කොන්දේසි;
(ආ) භාණ්ඩ ප්‍රමාණය හෝ ඒවායේ විස්තරය;
(ඇ) ප්‍රතිලාභියා;
(ඈ) ආරම්භක රට; සහ
(ඉ) ණය ගිණුමෙන් මුදල් ආපසු ගැනීම් සඳහා අවසාන දිනය එනම් ; 1998 ජුනි 30 වැනි දිනය, ඉක්මවා ණයවර ලිපියෙහි කල්පිරෙන දිනය දීර්ඝ කිරීම.

ඉහත සඳහන් (අ) සිට (ඉ) දක්වා ඇතුලත් නොවන සංශෝධන සඳහා ආ. සං. බැ. හි අනුමැතිය අවශ්‍ය නොවේ. ඉහත සඳහන් සංශෝධනයන්ට අනුමැතිය ලබා ගැනීම සඳහා නා. සං. අ. විසින් මෙම ලිපියෙහි ඇමුණුම් 2 හි දැක්වෙන ආකෘතිය මගින් ඔබ විසින් අත්සන් කරන ලද සංශෝධනයෙහි පිටපතක්ද සහිතව නොපමාව ඉල්ලුම් කළ යුතුය. මෙවැනි අවස්ථාවන්හිදී ණයවර ලිපියක සංශෝධනයන්හි පහත සඳහන් කොන්දේසිය ඇතුළත් විය යුතුය.

" මෙම සංශෝධනය බලාත්මක වනුයේ ආ. සං. බැ. හි අනුමැතිය ලැබුණු විට පමණි."

ආ. සං. බැ. විසින් අනුමැතිය දෙනු ලැබුවහොත් එය මෙම ලිපියෙහි ඇමුණුම් 3 හි දැක්වෙන ආකෘතිය මගින් ඔබගේ නියෝජිතයා වෙත මෙන්ම නා. සං. අ. වෙත ද දැනුම් දෙනු ඇත.

(ii) කල් ඉකුත් වන දිනය සහ නැව් ගත කිරීමේ දිනය, ණය ගිණුමින් මුදල් ගැනීමේ අවසන් දිනය දක්වා දීර්ඝ කිරීම් සඳහා ආ. සං. බැ. හි පූර්ව අනුමැතිය අවශ්‍ය නොවේ. එවැනි කාලය දීර්ඝ කිරීම් කරන ලද අවස්ථාවන්හිදී නා. සං. අ. විසින් මෙම ලිපියෙහි ඇමුණුම් 2 හි දැක්වෙන ආකෘතිය මගින් ඔබ විසින් නිසි පරිදි අත්සන් කරන ලද පිටපතක් ද සමග ආ. සං. බැ. වෙත නොපමාව දැනුම් දිය යුතුය. ආ. සං. බැ. හි පූර්ව අනුමැතියට යටත් වන හා නොවන සෑම සංශෝධනයකම පිටපත් දෙකක් ඔබ විසින් නා. සං. අ. වෙත යැවිය යුතු වන අතර නා.සං. අ විසින් ආ.සං. බැ. හි අනුමැතිය අවශ්‍ය අවස්ථාවන්හිදී එම අනුමැතිය ලබාදීම සඳහා කටයුතු යොදනු ඇත.

4. ආ. සං. බැ. මගින් බැඳීම් ලිපියක් නිකුත් කරන ලද ණයවර ලිපියක වගන්ති ප්‍රකාර ප්‍රතිලාභියෙකු වෙත ගෙවීමක් කරනු ලබන විට ඔබ නියෝජිතයා විසින් ඔබ වෙත අදාළ ලියකියවිලි ඉදිරිපත් කළ යුතු අතර මෙම ලිපියෙහි ඇමුණුම් 4 හි දැක්වෙන ආකෘතිය මගින් ආ. සං. බැ. වෙත ප්‍රතිපූරණය සඳහා ඉල්ලුම් කළ යුතුය. ඔබ නියෝජිතයා විසින් ප්‍රතිපූරණය සඳහා වන ඉල්ලුම් පතෙහි පිටපතක් නා. සං. අ. වෙතද ඉදිරිපත් කළ යුතුය. මුදා හැරීමේ කටයුතු නොපමාව සිදු කිරීම පහසු කිරීම සඳහා ඔබ නියෝජිතයා මෙම ලිපියෙහි ඇමුණුම් 5 හි දැක්වෙන ආකෘතිය මගින් අනුමැතිය තහවුරු කැරුන ස්විෆ්ට්, ටෙලෙක්ස් හෝ කේබල් පණිවුඩයක් මගින් ඉල්ලුම් කළ හැකිය. ඔබ නියෝජිතයා ආ. සං. බැ. වෙන් ප්‍රතිපූරණය කරනු ලැබූබව හැකිතාක් ඉක්මනින් ඔබ වෙත දැන්වීමට හැකිවන පරිදි ඔබ විසින් කටයුතු සැලැස්විය යුතු වන අතර ඔබ නියෝජිත වෙත ආ.සං. බැ. වෙන් ප්‍රතිපූරණය ලැබූ බවට ඔබ සෑහීමකට පත්වන තෙක් ඔබ නියෝජිතයාගේ නැව්ගත කිරීමේ ලියකියවිලි ඔබ භාරයේ රඳවා ගත යුතුය. ලියකියවිලි නිදහස් කරන අවස්ථාවේදී නා. සං. අ. වෙතින් ප්‍රතිපාර්ශවිය අරමුදල් අය නොකළ යුතුය.

5. නැව්ගත කිරීමේ ලියකියවිලිවල හා ණයවර ලිපියෙහි කොන්දේසි අතර යම් වෙනස්කමක්/ වෙනස්කම් පවතින විට ආ. සං. බැ. ට ගෙවීම සඳහා වන හිමිකම්පෑම් ගරුකළ නොහැකි වන අතර වාණිජ බැංකුව, (ගණුදෙනු කරන) විසින් නිකුත් කළ හෝ පිටසන් කළ හානි පූරණ ලිපියක් පිළිගැනීමට ද හැකි නොවේ. මෙවැනි අවස්ථාවලදී ගණුදෙනු කරන වාණිජ බැංකුව විසින් ඔබ මාර්ගයෙන් එවැනි වෙනස්කම් තිබුනද ගෙවීම් සඳහා අනුමැතිය නා.සං. අ. මගින් ලබා ගැනීමට කටයුතු කළ යුතුය.

ඔබ සමග සාකච්ඡා කිරීමෙන් අනතුරුව ගෙවීම සඳහා අනුමැතිය දුන් පසු නා. සං. අ. විසින් අදාළ අසමානතාවය හා ගණුදෙනු කරන බැංකුවට දෙනලද ගෙවීම් අනුමැතිය ලබාදීම පිළිබඳව කේබල් මගින් ආ. සං. බැ. වෙත දැන්විය යුතුය.

6. ආ. සං. බැ. විසින් එ. ජ. ඩොලර් නොවන වෙනත් මුල්‍ය ඒකකයකින් බැඳීමක් නිකුත් කළ විට එවැනි බැඳීමක් යටතේ ගෙවීම සඳහා එ. ජ. ඩොලර් නොවන මුල්‍ය ඒකකය ලබාගත හැකි වේ යයි ආ. සං. බැ. බලාපොරොත්තු වන විනිමය අනුපාතිකය පදනම මත තීරණය කරන ලද එ. ජ. ඩොලර් සමාන ප්‍රමාණය බැඳීම් ලිපියේ දක්වනු ඇත. එ. ජ. ඩොලර් නොවන වෙනත් මුල්‍ය ඒකකයකින් ගෙවීමක් සඳහා ඔබගේ ඕනෑම නියෝජිතයකු විසින් එවැනි හිමිකම්පෑමක් කළ අවස්ථාවකදී, එ. ජ. ඩොලර් සමාන ප්‍රමාණය ආ. සං. බැ. හි බැඳීම යටතේ ලබාගත හැකි ප්‍රමාණය ඉක්ම වන්නේ නම් ආ. සං. බැ. ප්‍රතිපූරණය, බැඳීම යටතේ ලබාගත හැකි එ. ජ. ඩොලර් ප්‍රමාණයේ එ. ජ. ඩොලර් නොවන ව්‍යවහාර මුදලින් වූ වටිනාකමට සීමා කරනු ඇත. මෙම හේතුව නිසා හෝ වෙනයම් හේතුවක් නිසා ඔබගේ ණයවර ලිපියෙහි වගන්ති ප්‍රකාර කරනු ලබන හිමිකම් පෑමක් සඳහා සම්පූර්ණ වශයෙන් හෝ කොටසක් වශයෙන් හෝ ඔබ නියෝජිතයා ප්‍රතිපූරණය කිරීම ආ.සං.බැ. ප්‍රතික්ෂේප කළහොත් ආ. සං. බැ. විසින් අනුමත නොකරන ලද ප්‍රමාණය ඔබ විසින් ඔබ නියෝජිතයාට ගෙවිය යුතුය. මෙම කරුණ සම්බන්ධයෙන් ඔබ විසින් නා. සං. අ. සමග අවශ්‍ය විධිවිධාන සලසා ගත යුතුය.

7. මේ සම්බන්ධයෙන් වන විනිමය පාලන අවශ්‍යතාවයන් පිළිබඳව විනිමය පාලක විසින් ඔබට උපදෙස් දෙනු ඇත.

8. ඔබගේ සියළුම අය කිරීම් නා. සං. අ. ගිණුමට හර විය යුතුය.

ඔබේ විශ්වාසී,

**එම්. බී. දිසානායක.**
*ප්‍රධාන ගණකාධිකාරී.*

පිටපත:-

1. විනිමය පාලක
2. අධ්‍යක්ෂ,
   නාගරික සංවර්ධන අංශ ව්‍යාපෘතිය,
   නාගරික සංවර්ධන අධිකාරිය,
   27, ඩී. ආර් විජේවර්ධන මාවත,
   කොළඹ -10.

බැංකු කටයුතු දෙපාර්තමේන්තුව,
විදේශ මුදල් අංශය.
1996 අප්‍රේල් 18 වැනි දින.

මෙහෙයුම් උපදෙස් අංක බීඩී/04/96

කළමණාකරු,
අගනුවර ශාඛාව - ආනයන දෙපාර්තමේන්තුව,
ලංකා බැංකුව,
යෝර්ක් වීදිය,
කොළඹ 01.

මහත්මයාණෙනි,

## ජා. සං. සං. 1698 සීර් - දෙවන වෘත්තීය පුහුණු ව්‍යාපෘතිය

ලෝක බැංකුවෙහි ජාත්‍යන්තර සංවර්ධන සංගමය මගින් ශ්‍රී ලංකාවට ප්‍රදානය කරන ලද උක්ත ණය යටතේ කරනු ලබන ආනයන කටයුතු සම්බන්ධයෙන් අනුගමනය කළයුතු ක්‍රියා පිළිවෙත පහත දැක්වේ.

1. ආනයනයන් කොළඹ 7, විජේරාම මාවත, 123,"සච්සිරිපාය", නිවාස, ඉදිකිරීම් සහ මහජන උපයෝගිතා අමාත්‍යාංශය, ඉදිකිරීම්, පුහුණු කිරීම් සහ සංවර්ධනය කිරීමේ ආයතනයෙහි සභාපති වෙනුවෙන් ඔබගේ බැංකුව විසින් ස්ථාපිත කරන ලද සහතික කළ අවලංගු කළ නොහැකි ආධීනතාවක් නොමැති ණයවර ලිපි මගින් සිදු කළ යුතුය.

2. ණයවර ලිපි ආරම්භ කිරීම සඳහා ඔබට බලය පැවරෙන්නේ විදේශ සම්පත් අධ්‍යක්ෂ විසින් " ජා. සං. සං. 1698 සීර් - දෙවන වෘත්තීය පුහුණු ව්‍යාපෘතිය " නමින් නිකුත් කරනු ලබන ප්‍රතිපාදන ලිපිය මගිනි.

3. මා විසින් වෙනත් උපදෙසක් දී නොමැත්තේනම් ඔබ විසින් විවෘත කරනු ලබන සෑම ණයවර ලිපියකම ජා. සං. සං. වෙතින් ගණුදෙනුකාර බැංකුව වෙත ප්‍රතිපූරණය ලැබෙනු ඇති බවටත් ණයවර ලිපිය වලංගු වනුයේ ජා. සං. සං. විසින් ගණුදෙනුකාර බැංකුව වෙත සිය විශේෂ බැඳුම්කරය නිකුත් කළවිට පමණක් බවටත් කොන්දේසියක් අඩංගු විය යුතුය.

4. ජා. සං. සං. වෙත විශේෂ බැඳුම්කරයක් සඳහා ඔබ ගණුදෙනුකරු විසින් අයදුම් කිරීම 1931 ෆෝර්මය (උද්ධෘතයක් අමුණා ඇත) මගින් කළ යුතු වන අතර පහත දැක්වෙන ලියකියවිලි මගින් එය තහවුරු විය යුතුය.

   (අ) ගෙවීමට අදාළ කොන්ත්‍රාත්තුවෙහි හෝ මිළදී ගැණුම් අණකරයෙහි පිටපතක් සහ
   (ආ) ඔබ බැංකුව විසින් නිකුත් කිරීමට යෝජනා කරන ණයවර ලිපියෙහි පිටපත් දෙකක්

5. සෑම ණයවර ලිපියක් සඳහාම කරනු ලැබූ සියළුම සංශෝධනයන්ගේ අනු පිටපත් ජා. සං. සං. ට සැපයීමට ගණුදෙනු කරන බැංකුවට උපදෙස් දිය යුතුය. ජා. සං. සං. විසින් පහත දැක්වෙන සංශෝධනයන් සඳහා එහි ලිඛිත අනුමැතිය සපයනු ඇත.

   (අ) ණයවර ලිපියෙහි වටිනාකම
   (ආ) භාණ්ඩවල ප්‍රමාණය හෝ භාණ්ඩ පිළිබඳ විස්තරය
   (ඇ) ප්‍රතිලාභියා සහ
   (ඈ) ණයවර ලිපියෙහි කල් ඉකුත්වන දිනය, මුලින් සඳහන් කළ දිනය හෝ ජා. සං. සං. විසින් නිකුත් කරන විශේෂ බැඳුම්කරයෙහි සඳහන් දිනය හය මසක් ඉක්මවා දීර්ඝ කිරීමක්.

   වෙනත් කිසිදු සංශෝධනයක් සඳහා ජා. සං. සං. හි පූර්ව අනුමැතිය අවශ්‍ය නොවේ.

6. උක්ත ණය මාලාව විශේෂ ගැණුම් හිමිකම් මගින් ප්‍රකාශිත බැවින් වෙනත් ව්‍යවහාර මුදල් වර්ගයකින් ප්‍රකාශිත ණයවර ලිපියක් සම්බන්ධයෙන් ජාත්‍යන්තර සංවර්ධන සංගමය විශේෂ බැඳුම්කර ලිපිය නිකුත්කිරීමේදී සිය බැඳීම විශේෂ ගැණුම් හිමිකම් මගින් දක්වනු ඇත. මෙම සීමාකරණය හේතුකොටගෙන ජා. සං. සං. මගින් ණයවර ලිපියෙහි සඳහන් මුළු විදේශ මුදල් ප්‍රමාණය විදේශයෙහි සිටින ඔබ නියෝජිතයාට ප්‍රතිපූරණය කරනු නොලබන්නේනම් මේ සම්බන්ධයෙන් විනිමය පාලක විසින් ඔබ වෙත නිකුත් කරන ලද උපදෙස්වලට අනුකූලව ගණුදෙනු කරනු ලබන බැංකුව වෙත අයවිය යුතු ශේෂය ඔබ විසින් ගෙවිය යුතුය.

7. මෙම ණය ක්‍රමය යටතේ ආනයනකරුවන් නාවික ලියකියවිලි සඳහා වන ලේඛනයන්හි රුපියල් වටිනාකම රජයේ ප්‍රතිපාර්ශවීය අරමුදල් ගිණුමට ගෙවීම අවශ්‍ය නොවේ. එබැවින් ඔබ වෙත හෝ ඔබ ගණුදෙනු කරන බැංකුව වෙත අයවිය යුතු කොමිස්, අය කිරීම් ආදිය වේ නම් ඒවා අයකර ගැනීමෙන් පසු එම ලියකියවිලි ඔබට ලැබුණු වහාම ඔබ ගණුදෙනුකරුවන් වෙත මුදා හැරිය යුතුය

8. ණයවර ලිපි හා සංශෝධන කිසිවක් වේ නම් ඒවායෙහි පිටපත් කොළඹ, ශ්‍රී ලංකා මහ බැංකුවෙහි ප්‍රධාන ගණකාධිකාරී ගේ දැන ගැනීම පිණිස ඉදිරිපත් කළ යුතුය.

9. මේ සම්බන්ධයෙන් සිය අවශ්‍යතා පිලිබඳව විනිමය පාලක විසින් ඔබ වෙත වෙනම උපදෙස් සපයනු ඇත.

ඔබේ,
විශ්වාසී,

**ඒ. ෂන්මුගසාමි,**
අතිරේක ප්‍රධාන ගණකාධිකාරී.

පිටපත් :-

1. සභාපති,
   ඉදිකිරීම්, පුහුණු කිරීම් සහ සංවර්ධනය කිරීමේ ආයතනය,
   "සව්සිරිපාය"
   123, විජේරාම මාවත,
   කොළඹ 07.

2. විනිමය පාලක

---

විදේශීය මූල්‍ය අංශය,
බැංකු කටයුතු දෙපාර්තමේන්තුව,
1996 මැයි මස 21 වැනි දින.

දුරකථනය : 872604

මෙහෙයුම් උපදෙස් අංකය: බිඩ්/05/96

සියළුම වාණිජ බැංකු වෙත.

## යෙන් 71,148,000/- ජපන් / ශ්‍රී ලංකා විශේෂ ප්‍රදානය (22 වැනි ණය සහන ප්‍රදානය)

1995 දෙසැම්බර් මස 27 දින අත්සන් තබන ලද ගිවිසුමක නියමයන් අනුව, තෝරා ගන්නා ලද රටවල් වලින් වූ ආනයනයන් මූල්‍යනය කිරීම සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ රජයට ජපාන රජය විසින් ප්‍රදානයක් ලබා දී ඇත. මෙම ප්‍රදානය යටතේ ආනයනයන් සඳහා ප්‍රතිපාදනයන් විදේශ සම්පත් අධ්‍යක්ෂ විසින් නිකුත් කරනු ලැබේ. එවන් ආනයනයන් සඳහා වන ගණුදෙනු වලදී මෙම උපදෙස්වල සඳහන් කොට ඇති ක්‍රියාමාර්ග අනුගමනය කරන ලෙස වාණිජ බැංකු වලින් ඉල්ලා සිටිනු ලැබේ.

2. සැපයුම්කරු සමග ඇති කරගත් ගිවිසුමේ පිටපතක් ද විදේශ සම්පත් අධ්‍යක්ෂ විසින් නිකුත් කරන ලද බලය පැවරීමේ ලිපියක් ද සමග ප්‍රතිපාදනයක හිමිකරුවෙකු අයැදුම් කළ අවස්ථාවක, වාණිජ බැංකුවකට සැපයුම්කරුගේ රටෙහි තමාගේ ගණුදෙනුකරුවන්ගේ මාර්ගයෙන් සැපයුම්කරු වෙනුවෙන් මෙම පහසුකම යටතේ අවලංගු කළ නොහැකි ණයවර ලිපියක් විවෘත කළ හැකිය. එවන් සෑම ණයවර ලිපියකම අනුක්‍රමික අංකයට මුලින් පිළිවෙලින් ආරම්භක බැංකුවේ හඳුනා ගැනීමේ අංකය සහ "1 වැනි යෙන් ප්‍රදානය 1996" යන්න යොදා තිබිය යුතුය

3. ජපානයේ, ටෝකියෝ හි සීමාසහිත ටෝකියෝ බැංකුවෙහි ජාත්‍යන්තර සේවා බැංකු කටයුතු අංශයෙහි වූ ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ ආණ්ඩුවේ අංක 522 - 0021423 දරණ යෙන් සාමාන්‍ය තැන්පතු ගිණුම හර කිරීමෙන් ගණුදෙනුකාර බැංකුව විසින් ප්‍රතිපූරණය ලබා ගත යුතු බව සෑම ණයවර ලිපියකම සඳහන් විය යුතුය. ලියකියවිලි ණයවර ලිපියේ නියමයනට එකඟ වන බවටත්, එම ලියකියවිලි ණය විවෘත කරන බැංකුව වෙත යවා ඇති බවටත් ගණුදෙනුකාර බැංකුවෙන් ලබාගත් සහතිකයක් සමඟ ප්‍රතිපූරණය ඉල්ලා සිටිය යුතුය. ණයවර ලිපිය විවෘත කළ වහාම ණය විවෘත කරන බැංකුව විසින් සෑම ණයවර ලිපියකම පිටපත් දෙකක් ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන ගණකාධිකාරී වෙත ඉදිරිපත් කළ යුතුය. ඉන් අනතුරුව ප්‍රධාන ගණකාධිකාරී විසින් ණය සම්බන්ධයෙන් වූ ප්‍රතිපූරණ අවසර ලිපියක් ටෝකියෝවෙහි සීමාසහිත ටෝකියෝ බැංකුව වෙත නිකුත් කරනු ලැබේ. මෙම ලිපිය නොමැතිව ගණුදෙනුකාර බැංකුව වෙත ප්‍රතිපූරණය කිරීම සිදු කරනු නොලැබේ.

4. ගණුදෙනු කාර බැංකුවෙන් ලියවිලි ලැබුණු විට ණය විවෘත කරන බැංකුව ඒවා ආනයන කරු වෙත මුදා හැරිය යුත්තේ එම ලියකියවිලි වල රුපියල් වටිනාකම ලබා ගැනීමෙන් පසුව පමණකි. එම ලියකියවිලි ආනයනකරු වෙත මුදා හැරීමට පෙර ලියකියවිලිවල මුළු වටිනාකම ලබාගත් බවට වාණිජ බැංකු තහවුරු කරගත යුතුයි. අදාළ බැංකුව වෙත ලියකියවිලි ලැබී ඇති බවට උපදෙස් ලැබී දින 10 ක් ඇතුලත දී ආනයනකරු විසින් ගෙවීම් කළ යුතුය.

5. නිශ්චිත කාලය වන දින 10 තුළ දී ලියකියවිලි වල වටිනාකම් ගෙවීමට ආනයනකරු අපොහොසත් වුවහොත් බැංකුව වෙත ලියකියවිලි ලැබුණු බවට උපදෙස් ලැබූ දින සිට බිලගෙවා අවසන්කරන දිනය තෙක් බැංකු අනුපාතිකය සියයට 3 කින් ඉක්මවූ පොළියක් ගෙවීමට ආනයනකරුට සිදුවනු ඇත.

6. ආනයනකරුගෙන් ලබාගත් ලියකියවිලිවල රුපියල් වටිනාකම මහ බැංකුව වෙත ගෙවීමේ දී වාණිජ බැංකුව විසින් මෙම මෙහෙයුම් උපදෙස්වල යොමුව සඳහන් කරමින් පහත සඳහන් තොරතුරු සැපයිය යුතුයි.

(අ) ආනයනකරුගේ නම සහ ලිපිනය
(ආ) ණයවර ලිපියේ අංකය
(ඇ) අපනයනකරුගේ නම
(ඈ) යෙන් වල සමානුපාතිකය (ලියකියවිලිවල වටිනාකම මාරු කළ හැකි වෙනත් ව්‍යවහාර මුදලක් මගින් සඳහන් කොට තිබේ නම් දැක්විය යුතුය.)
(ඉ) බලපාන විනිමය අනුපාතිකය (ජපන් යෙන් අනුපාතිකයද ඇතුළුව)
(ඊ) ලියකියවිලි ලැබුණු දිනය
(උ) ආනයනකරු වෙත දැන්වූ දිනය
(ඌ) ආනයනකරු විසින් ගෙවීම් කරන ලද දිනය

7. ගෙවීම් කරන විට ගෙවීම් කරනු ලබන නැව්ගත කිරීමට අදාළ පහත සඳහන් සෑම ලියවිල්ලකම පිටපතක් අමුණා එවීමට වාණිජ බැංකු වගබලා ගත යුතුයි.

(i) ඉන්වොයිසිය
(ii) නෞභාර පත්‍රය / ගුවන් බිල්පත්‍රය
(iii) සැපයුම්කරු වෙත මුදල් ගෙවන ලද දිනය හා ගෙවූ ප්‍රමාණයට සාක්ෂි දරණ ලියකියවිලි

**එම්. බී. දිසානායක**
ප්‍රධාන ගණකාධිකාරී

පිටපත් :-

1. විදේශ සම්පත් අධ්‍යක්ෂ ජෙනරාල්,
විදේශ සම්පත් දෙපාර්තමේන්තුව,
මහ ලේකම් කාර්යාලය,
කොළඹ - 1.

2. විනිමය පාලක.

බැංකු කටයුතු දෙපාර්තමේන්තුව,
විදේශ මුදල් අංශය.
1996 අගෝස්තු 29 වැනි දින.

මෙහෙයුම් උපදෙස් අංක ඕඩී/06/96

කළමණාකරු,
ලංකා බැංකුව,
ආයතනික ශාඛාව,
කොළඹ 01.

මහත්මයාණෙනි,

## ජා. සං. සං. 2249 සීර් - දෙවන විදුලි සංදේශ ව්‍යාපෘතිය

ලෝක බැංකුවෙහි ජාත්‍යන්තර සංවර්ධන සංගමය මගින් ශ්‍රී ලංකාවට ප්‍රදානය කරන ලද උක්ත ණය යටතේ කරනු ලබන ආනයන කටයුතු සම්බන්ධයෙන් අනුගමනය කළයුතු ක්‍රියා පිළිවෙත පහත දැක්වේ.

1. ආනයනයන්, කොළඹ 1, ලෝටස් පාර, ශ්‍රී ලංකා ටෙලිකොම් මුලස්ථානයෙහි ශ්‍රී ලංකා ටෙලිකොම්, සාමාන්‍යාධිකාරී (මිළදී ගැනීම්) වෙනුවෙන් ඔබ බැංකුව විසින් ස්ථාපිත කරනු ලබන, සහතික කරන ලද, අවලංගු කළ නොහැකි, ආධිනතාවයක් නොමැති ණයවර ලිපි මගින් සිදු කළ යුතුය.

2. ඔබගේ ණයවර ලිපි ආරම්භ කිරීම සඳහා ඔබට බලය පැවරෙන්නේ විදේශ සම්පත් අධ්‍යක්ෂ විසින් "ජා. සං. සං. 2249 සීර් - දෙවන විදුලි සංදේශ ව්‍යාපෘතිය " නමින් නිකුත් කරනු ලබන ප්‍රතිපාදන ලිපිය මගිනි.

3. මා විසින් වෙනත් උපදෙසක් දී නොමැත්තේ නම් ඔබ විසින් විවෘත කරනු ලබන සෑම ණයවර ලිපියකම ජා. සං. සං. වෙතින් ගණුදෙනුකාර බැංකුව වෙත ප්‍රතිපූරණය ලැබෙනු ඇති බවටත් ණයවර ලිපිය වලංගු වනුයේ ජා. සං. සං. විසින් ගණුදෙනුකාර බැංකුව වෙත සිය විශේෂ බැඳුම්කරය නිකුත්කළවිට පමණක් බවටත් කොන්දේසියක් අඩංගු විය යුතුය.

4. ජා. සං. සං. වෙත විශේෂ බැඳුම්කරයක් සඳහා ඔබ ගණුදෙනුකරු විසින් අයදුම් කිරීම 1931 පෝරමය (උද්ධෘතයක් අමුණා ඇත) මගින් කළ යුතු වන අතර එය පහත දැක්වෙන ලියකියවිලි මගින් තහවුරු විය යුතුය.

    (අ) ගෙවීමට අදාළ කොන්ත්‍රාත්තු හෝ මිළදී ගැණුම් අණකරයෙහි පිටපතක් සහ
    (ආ) ඔබ බැංකුව විසින් නිකුත් කිරීමට යෝජනා කරන ණයවර ලිපියෙහි පිටපත් දෙකක්

5. සෑම ණයවර ලිපියක් සඳහාම කරනු ලැබූ සියළුම සංශෝධනයන්ගේ අනු පිටපත් ජා. සං. සං. ට සැපයීමට ගණුදෙනු කරන බැංකුවට උපදෙස් දිය යුතුය. ජා. සං. සං. විසින් පහත දැක්වෙන සංශෝධනයන් සඳහා එහි ලිඛිත අනුමැතිය සපයනු ඇත.

    (අ) ණයවර ලිපියෙහි වටිනාකම
    (ආ) භාණ්ඩවල ප්‍රමාණය හෝ භාණ්ඩ පිලිබඳ විස්තරය
    (ඇ) ප්‍රතිලාභියා සහ
    (ඈ) ණයවර ලිපියෙහි මුලින් සඳහන් කල් ඉකුත්වන දිනය හෝ ජා. සං. සං. විසින් නිකුත් කරන ලද විශේෂ බැඳුම්කරයෙහි සඳහන් දිනය හය මසක් ඉක්මවා දීර්ඝ කිරීමක්.

    වෙනත් කිසිදු සංශෝධනයක් සඳහා ජා. සං. සං. හි පූර්ව අනුමැතිය අවශ්‍ය නොවේ.

6. උක්ත ණය මාලාව විශේෂ ගැණුම් හිමිකම් මගින් ප්‍රකාශිත බැවින් වෙනත් ව්‍යවහාර මුදල් වර්ගයකින් ප්‍රකාශිත ණයවර ලිපියක් සම්බන්ධයෙන් ගණුදෙනු කරනු ලබන බැංකුවලට ජා. සං. ස විශේෂ බැඳුම්කර ලිපිය නිකුත් කිරීමේදී සිය බැඳීම විශේෂ ගැණුම් හිමිකම් මගින් දක්වනු ඇත. මෙම සීමාකරණය හේතුකොටගෙන ජා. සං. සං. මගින් ණයවර ලිපියෙහි සඳහන් මුළු විදේශ මුදල් ප්‍රමාණය විදේශයෙහි සිටින ඔබ නියෝජිතයාට ප්‍රතිපූරණය කරනු නොලබනයේ නම් මේ සම්බන්ධයෙන් විනිමය පාලක විසින් ඔබ වෙත නිකුත් කරන ලද උපදෙස්වලට අනුකූලව, ගණුදෙනු කරනු ලබන බැංකුව වෙත අයවිය යුතු ශේෂය ඔබ විසින් ගෙවිය යුතුය.

7. මෙම ණය ක්‍රමය යටතේ ආනයනකරුවන් නාවික ලියකියවිලි සඳහා වන ලේඛනයන්හි රුපියල් වටිනාකම රජයේ ප්‍රතිපාර්ශවීය අරමුදල් ගිණුමට ගෙවීම අවශ්‍ය නොවේ. එබැවින් ඔබ වෙත හෝ ඔබ ගණුදෙනු කරන බැංකුව වෙත අයවිය යුතු කොමිස්, අය කිරීම් ආදිය වේ නම් ඒවා අයකර ගැනීමෙන් පසු එම ලියකියවිලි ඔබට ලැබුණු වහාම ඔබ ගණුදෙනුකරුවන් වෙත මුදා හැරිය යුතුය.

8. ණයවර ලිපි හා සංශෝධන කිසිවක් වේ නම් ඒවායෙහි පිටපත් කොළඹ, ශ්‍රී ලංකා මහ බැංකුවෙහි ප්‍රධාන ගණකාධිකාරී ගේ දැන ගැනීම පිණිස ඉදිරිපත් කළ යුතුය.

9. මේ සම්බන්ධයෙන් සිය අවශ්‍යතා පිළිබඳව විනිමය පාලක විසින් ඔබ වෙත වෙනම උපදෙස් සපයනු ඇත.

ඔබේ
විශ්වාසී,

**ඒ. ෂන්මුගසාමි.**
*අතිරේක ප්‍රධාන ගණකාධිකාරී.*

පිටපත් :-

1. විනිමය පාලක
2. සාමාන්‍යාධිකාරී (මිලදී ගැනීම්),
   ශ්‍රී ලංකා ටෙලිකොම්,
   ශ්‍රී ලංකා ටෙලිකොම් මූලස්ථානය,
   ලෝටස් පාර,
   කොළඹ 1.

---

බැංකු කටයුතු දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව.
කොළඹ - 10.
1996 ඔක්තෝම්බර් මස 14 වැනි දින.

මෙහෙයුම් උපදෙස් අංකය බ්ඩ්/07/96

සියළුම වාණිජ බැංකු වෙත.

## ඇමෙරිකානු එක්සත් ජනපද ඩොලර් දශ ලක්ෂ 15 ක් සඳහා වන ඉන්දු ශ්‍රී ලංකා ණය ගිවිසුම ආනයන සඳහා ගෙවීමේ ක්‍රියා මාර්ගය

ශ්‍රී ලංකා රජය සමග ගිවිස ගන්නා ලද ණය ගිවිසුමක් ප්‍රකාරව ද්විපාර්ශවික රජයයන් විසින් අනුමත කැරුණු කොන්ත්‍රාත්තු යටතේ ඇ. එ. ප. ඩොලර් දශලක්ෂ 15ක් දක්වා වන සීමාවකට යටත්ව ඉන්දියාවෙන් ශ්‍රී ලංකාව වෙත ගෙන්වනු ලබන ප්‍රාග්ධන භාණ්ඩ, කල්පවත්නා පාරිභෝගික භාණ්ඩ හා උපදේශක සේවා සඳහා වන ආනයනය වියදම් වලින් සියයට 90ක් ඉහත සඳහන් ණය මගින් මූල්‍යනය කිරීමට ඉන්දියානු රජය එකග වී ඇත.

2. එබඳු ප්‍රතිපාදනයක් හෝ නිශ්චිත ආනයන බලපත්‍රයක් ලද ඉල්ලුම්කරුවන් ඔවුන්ගේ සැපයුම්කරුවන් සමග ඇති කරගත් කොන්ත්‍රාත්තුවෙහි පිටපත් සමග ඇයදුම් කළ අවස්ථාවකදී වාණිජ බැංකුව පහත දැක්වෙන පරිදි ක්‍රියා කළ යුතුවේ :-

(අ) ආසියානු නිශ්කාෂණ සංගමයෙහි වැඩපිළිවෙලට අනුකූලව මෙම ගිවිසුමෙහි නැ. වි. ය. වටිනාකමෙන් 10% ඉන්දියාවෙහි සැපයුම්කරුවන් වෙත ඇ. එ. ප. ඩොලර් වලින් ප්‍රේෂණය කළ යුතු වේ.

(ආ) ගිවිසුමෙහි නැ. වි. ස. වටිනාකමෙන් සියයට 90% සඳහා සැපයුම්කරුවන් වෙත ඇ. එ. ප. ඩොලර් වලින් ණයවර ලිපියක් විවෘත කළ යුතුයි. එම ණයවර ලිපිය නවදිල්ලියේ පිහිටි ඉන්දියානු රාජ්‍ය බැංකුවෙහි එතෙර ශාඛාව මගින් සැපයුම්කරුවන් වෙත සෘජුවම හෝ ඉන්දියාවෙහි වෙනත් බැංකුවක් මගින් ගිවිසුමේ පිටපතක්ද සමගින් දැනුම් දිය යුතුවේ ණයවර ලිපිය වෙනත් බැංකුවක් මගින් ක්‍රියාත්මක වන්නේ නම් ණයවර ලිපියෙහි හා ගිවිසුමෙහි පිටපත් නවදිල්ලියෙහි පිහිටි ඉන්දියානු රාජ්‍ය බැංකුවෙහි එතෙර ශාඛාව වෙත ඉදිරිපත් කළයුතුවේ. ණයවර ලිපියෙහි ඉන්දියානු රජය මගින් ගිවිසුමට අනුමැතිය දී නිකුත් කරන ලද ලිපියෙහි සම්බන්ධ අංකය හා දිනය සඳහන් කළ යුතු අතර ණයවර ලිපියට පසුව කෙරෙන සංශෝධනයන් සඳහාද අදාල පරිදි ඉන්දියානු රජයේ අනුමැතිය පිළිබඳව එවැනිම තොරතුරු ඉදිරිපත් කළ යුතුවේ.

3. මෙම උපදෙස් පදනම් කරගෙන නිකුත් කරනලද සැම ණයවර ලිපියකම පහත සඳහන් වගන්ති ඇතුලත් කළ යුතුයි.

1. නවදිල්ලියේ පිහිටි ඉන්දියානු රාජ්‍ය බැංකුවෙහි එතෙර ශාඛාව ගිවිසුමෙහි නැ. වි. ස. වටිනාකමෙන් සියයට 90 ක ප්‍රමාණයක් ඉන්දියානු ජන රජය විසින් ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජන රජය වෙත ප්‍රදානය කරන ලද ඇ. එ. ප. ඩොලර් දශ ලක්ෂ 15 (ඇ. එ. ප. ඩොලර් දශ ලක්ෂ පහළොවක) ණය මුදලින් ප්‍රතිපූරණය කරනු ඇත. නවදිල්ලියේ පිහිටි ඉන්දියානු රාජ්‍ය බැංකුවෙහි එතෙර ශාඛාව, විසින් එය ක්‍රියාත්මක බව නිවේදනය කිරීමෙන් අනතුරුව ලිපිය ගණුදෙනු කළ හැකිවේ. නවදිල්ලියෙහි පිහිටි ඉන්දියානු රාජ්‍ය බැංකවෙහි ණයවර එතෙර ශාඛාව විසින් නැ. වි. ස. වටිනාකමන් සියයට 90 සීමාව නිශ්චය කර ගැනීමෙන් පසු ණයවර ලිපිය ක්‍රියාත්මක කළ යුතු අතර ණයවර ලිපියෙහි ඉතිරි සියයට 10 නිදහස් විදේශ විනිමය මගින් ලබා ගන්නා ලද බව තහවුරු ගණුදෙනුකාර බැංකුවෙහි වගකීම වේ. නවදිල්ලියේ පිහිටි ඉන්දියානු රාජ්‍ය බැංකුවෙහි එතෙර ශාඛාව වෙත ඉදිරිපත් කෙරෙන නැ. වි. ස. වටිනාකමෙන් සියයට 90 ගෙවීම සඳහා වන හිමිකම් පෑම් සමග ඉතිරි සියයට 10 වටිනාකම සෘජු ගෙවීමක් ලෙස ලැබුන බවටත් ණයවර ලිපියෙහි සියලුම නියමයන් සපුරා ඇති බවටත් ගණුදෙනු කරන බැංකුවෙහි සහතිකයක් අමුණා තිබිය යුතුය.

4. මෙම උපදෙස් අනුව නිකුත් කරන ලද සෑම ණයවර ලිපියකම ගණුදෙනුකාර බැංකුව විසින් ලියකියවිලි වල මුල් පිටපත් ශ්‍රී ලංකාවෙහි ණයවර ලිපිය විවෘත කරන ලද බැංකුවට කෙලින්ම ඉදිරිපත් කරන බවට හා ගිවිසුමෙහි වටිනාකමෙන් සියයට 10 කට සමාන මුදලක් ගණුදෙනුකාර බැංකුවට ලැබුන බව සහ ණයවර ලිපියෙහි සියළු කොන්දේසි සපුරා ඇති බවට සහතිකයක්ද සහිතව 1996 ඉන්දු ශ්‍රී ලංකා ණය ගිවිසුමෙහි කොන්දේසි අනුව ප්‍රතිපූරණය පිණිස නවදිල්ලියේ පිහිටි ඉන්දියානු රාජ්‍ය බැංකුවෙහි එහෙර ශාඛාව වෙත ඉදිරිපත් කළ යුතු බවට කොන්දේසි අඩංගු විය යුතුය නවදිල්ලියේ පිහිටි ඉන්දියානු රාජ්‍ය බැංකුවෙහි එතෙර ශාඛාව වෙත ප්‍රතිපූරණය සඳහා හිමිකම් පෑමේදී ඉන්වොයිසි වල පිටපත් හා නෞගාරපත් වල ගණුදෙනු කළ නොහැකි පිටපත් ඉදිරිපත් කිරීමට ගණුදෙනුකාර බැංකුවට උපදෙස් දිය යුතුය. ගණුදෙනු කරණ ලද ලියකියවිලි වල වටිනාකම සමග ගණුදෙනුකාර බැංකුවෙහි සියලුම වියදම්ද නවදිල්ලියේ පිහිටි ඉන්දියානු රාජ්‍ය බැංකුවෙහි එතෙර ශාඛාව වෙතින් හිමිකම් පෑමට හැකිවන ආන්දමට ණයවර ලිපියෙහි ප්‍රතිපාදන සැලසිය යුතුය. නවදිල්ලියෙහි ඉන්දියානු රාජ්‍ය බැංකුවෙහි එතෙර ශාඛාව මගින් ද මුදා හරිනු ලබන වටිනාකමින් සියයට 1 කින්. 1/10 ක ප්‍රමාණයක මුදා හැරීමේ ගාස්තුවක්ද අතට පාඩු වියදමක් ලෙස මෙම ණය ගිවිසුම යටතේ අයකරගනු ඇත. ප්‍රාග්ධන භාණ්ඩ ආනයනය සම්බන්ධයෙන් වන විට ගෙවීම සඳහා ණයවරලිපි 31. 01. 97 දින වන විට විවෘත කොට තිබිය යුතු අතර ගෙවීම් සඳහා 31.01.98 දිනෙන් පසු වලංගු නොවිය යුතුය. උපදේශක සේවා සහ කල් පවත්නා පාරිභෝගික භාණ්ඩ සම්බන්ධයෙන් 31. 01.97 දින වන විට ණයවර ලිපි විවෘත කොට සම්පූර්ණ මුදල ලබා ගෙන තිබිය යුතුය.

5. සියළුම වාණිජ බැංකු විසින්ම මෙම උපදෙස් ප්‍රකාර නිකුත් කරනු ලබන්නාවූ සෑම ණයවර ලිපියකම පිටපතක් ශ්‍රී ලංකා මහබැංකුවේ ප්‍රධාන ගණකාධිකාරී වෙත ඉදිරිපත් කළ යුතු අතර ඒ සමග පහත සඳහන් අයිතමයන්හි රුපියල් වටිනාකම රජයේ ප්‍රතිපාර්ශවීය අරමුදල් ගිණුමට බැරවන පරිදි ශ්‍රී ලංකා මහබැංකුව වෙත ගෙවන බවට පොරොන්දු ලිපියක්ද එවිය යුතුය.

(i) නවදිල්ලියේ ඉන්දියානු රාජ්‍ය බැංකුව විසින් මුදා හරින ලද ප්‍රමාණය; එනම් බිල්පත්වල නැ. වි. ස. වටිනාකමින් සියයට 90 ක්ද;

(ii) ඉන්දියාවෙහි ගණුදෙනුකාර බැංකුවෙහි බැංකු ගාස්තු;

(iii) නවදිල්ලියේ ඉන්දියානු රාජ්‍ය බැංකුවෙහි එතෙර ශාඛාවෙහි ගාස්තු එනම් හිමිකම් පාන අගයෙන් සියයට 1න්1/10ක්;

(iv) ඉහත දැක්වෙන (i), (ii) සහ (iii) යන වටිනාකම්වල එකතුව සඳහා පවත්නා බැංකු අනුපාතය (වර්තමානයෙහි වසරකට සියයට 17ක්) යටතේ නෞගාර පත්‍රයෙහි සඳහන් දින සිට ආනයන කරු මුදල් ගෙවන දිනය අතර කාලසීමාව සඳහා අය කරනු ලබන පොලිය

6. මෙම ණය ගිවිසුම යටතේ ආනයන වල නැ. වි. ස. වටිනාකමින් සියයට 90 මත සියයට 5 ක බදු ප්‍රතිදානයක් ප්‍රදානය කිරීමට තීරණය කර ඇත. ආනයන සඳහා වාර්ෂික ආයවැය ප්‍රතිපාදන යටතේ අරමුදල් ලබන රාජ්‍ය අංශයේ ආයතන විසින් කරනු ලබන ආනයන සඳහා මෙම ප්‍රතිදානය අදාළ නොවේ. මේ අනුව ඉහත පරිච්ඡේදයේ සඳහන් ප්‍රමාණය ආනයනකරුවන්ගෙන් එකතු කොට පහත සඳහන් පරිදි ශ්‍රී ලංකා මහ බැංකුවෙහි ප්‍රධාන ගණකාධිකාරී වෙත ප්‍රේෂණය කළ යුතුය.

(අ) ඉහත සඳහන් රාජ්‍ය අංශයේ හැර අනෙකුත් ආනයනකරුවන් සඳහා ආනයන වල නැ. වි. ස. වටිනාකමින් සියයට 90 න් සියයට 5ක ප්‍රමාණයක් රඳවා ගත් පසු ඉතිරිය (එසේ ඉතිරිවන ප්‍රමාණය රේගුවෙන් බදු ඉවත් කරගත් බවට සාක්ෂි සහිත ලියකියවිලි ඉදිරිපත් කළ විට ආනයනකරුට ආපසු ගෙවිය යුතුය.)

(ආ) ඉහත සඳහන් රාජ්‍ය අංශයේ ආනයනකරුවන් සඳහා ඉහත 5වන පරිච්ඡේදයේ දැක්වෙන පරිදි ආනයනකරුගෙන් එකතු කරගනු ලබන මුළු වටිනාකම

මෙම මුදලට සමානුපාත ශ්‍රී ලංකා රුපියල් ප්‍රමාණය ගණනය කිරීම එදිනට ඇමරිකානු එක්සත් ජනපද ඩොලරය සඳහා වාණිජ බැංකු වල පවතින එතැන් විකුණුම් අනුපාතිකය අනුව සිදුකළ යුතුය.

7. ඉහත සඳහන් කොන්දේසිවලට අනුව ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ගෙවීම් කිරීමේදී ශ්‍රී ලංකාවෙහි වාණිජ බැංකු විසින් පහත සඳහන් තොරතුරු ඉදිරිපත් කළයුතු වේ

(අ) ආනයනකරුගේ නම
(ආ) විදේශ සම්පත් අධ්‍යක්ෂ ජනරාල් ප්‍රතිපාදනයන් නිකුත් කළ දිනය හා අංකය සහ කිසියම් ආනයන බලපත්‍රයක් වේනොත් එහි අංකය
(ඇ) ණයවර ලිපියෙහි අංකය හා බිල්පතේ අංකය
(ඈ) සැපයුම් කරු වෙත හෝ ගණුදෙනුකාර බැංකුව වෙත නවදිල්ලියේ ඉන්දියානු රාජ්‍ය බැංකුවෙහි එතෙර ශාඛාව විසින් ගෙවන ලද මුදල හා දිනය
(ඉ) ඉන්දියාවෙහි ගණුදෙනුකාර බැංකුවෙන් ශ්‍රී ලංකාවෙහි වෙළද බැංකුව වෙත ලැබුන ලියකියවිලි සම්පූර්ණ වටිනාකම
(ඊ) නෞගාර පත්‍රයේ සඳහන් වන දිනය
(උ) ආනයනකරු විසින් ප්‍රතිපාර්ශවීය අරමුදල් ගෙවූ දිනය

8. ඉහත 5හා 6 ඡේදයන් යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව වෙත අයවිය යුතු මුදල් ගෙවිය යුතු අවස්ථාවේදී ගෙවීමට ආනයන කරුවන් සමග කටයුතු පිළියෙල කිරීම හා එකී මුදල් ගෙවන බවට වග බලා ගැනීම මෙම උපදෙස් ප්‍රකාර ණයවර ලිපියක් නිකුත් කරනු ලබන සියළුම වාණිජ බැංකුවල වගකීම වේ. ශ්‍රී ලංකා මහ බැංකුව වෙත අයවිය යුතු ගෙවීම් කොට අවසාන වන තුරු ආනයනකරුවන් වෙත කිසිදු ලියකියවිල්ලක් වාණිජ බැංකුව විසින් කිසිසේත්ම නිදහස් නොකළ යුතු වේ.

9. ගැල්කුලී හා / හෝ රක්ෂණය සඳහා අනුමත ප්‍රේෂණයන් ඉහත 2 වන (අ) ඡේදය යටතේ සියයට 10 ප්‍රේෂණය කරන අවස්ථාවේදී ගෙවිය හැකිය.

10. මේ සම්බන්ධයෙන් විනිමය පාලක විසින් විනිමය පාලණ අවශ්‍යතා පිළිබඳව බැංකුව වෙත උපදෙස් දෙනු ඇත.

11. කරුණාකර මෙම උපදෙස් ලැබුණ බව දන්වන්නේ නම් මැනවි.

ප්‍රධාන ගණකාධිකාරි.

පිටපත : විනිමය පාලක

බැංකු කටයුතු දෙපාර්තමේන්තුව,
1996 දෙසැම්බර් 18 වැනි දින.

මෙහෙයුම් උපදෙස් අංක: බඩ/08/96

කළමනාකරු,
මහජන බැංකුව,
ජාත්‍යන්තර අංශය,
කොළඹ - 01.

මහත්මයාණෙනි,

## ආනයන සඳහා ක්‍රියාපිළිවෙල - ආ. සං. බැ. ණය අංක 1414 ශ්‍රී (එස්එෆ්)

## විදුලිබල පද්ධතිය පුළුල් කිරීමේ දෙවන ව්‍යාපෘතිය

ආසියානු සංවර්ධන බැංකුව (මින් ඉදිරියට ආ. සං. බැ. යනුවෙන් හැඳින් වේ.) ග්‍රාමීය විදුලිබල යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම හා විදුලිබල පද්ධතිය පුළුල් කිරීමේ දෙවන ව්‍යාපෘතිය යටතේ විදුලිබලය බෙදාහැරීමේ කටයුතු සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය වෙනුවෙන් ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජන රජයට විශේෂ 53,528,000.00 ක සමාන මුදලක් ණය වශයෙන් ලබා දීමට එකඟ වී ඇත. මෙම ව්‍යාපෘතිය ලංකා විදුලිබල මණ්ඩලය (මින් ඉදිරියට ලං. වි. ම. යනුවෙන් හැඳින්වේ.) සහ සීමාසහිත ලංකා විදුලිබල (පුද්ගලික) සමාගම (මින් ඉදිරියට ලං. වි. ස. යනුවෙන් හැඳින්වේ.) මගින් ක්‍රියාත්මක කෙරේ. ණය මුදලින් කොටසක් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ආයතන විසින් ව්‍යාපෘතිය සඳහා උපකරණ ආනයනය කිරීම සඳහා යොදවනු ඇත. මෙම ව්‍යාපෘතිය යටතේ කරනු ලබන ආනයන සම්බන්ධයෙන් ඔබ විසින් පහත සඳහන් ක්‍රියාපිළිවෙල අනුව කටයුතු කිරීම අවශ්‍ය වේ.

2. සුදුසුකම් ලැබූ මූලාශ්‍ර රට වලින් කළයුතු සියළුම ආනයන ලං. වි. ම. සහ ලං. වි. ස. යේ ඉල්ලීම මත ඔබ විසින් ආරම්භ කරන ලද සහතික කරන ලද අවලංගු කළ නොහැකි, අධිනතාවක් නොමැති ණයවර ලිපි මගින් කළ යුතුය. මෙවැනි සෑම ණයවර ලිපියකම පහත සඳහන් වගන්තිය ඇතුලත් විය යුතුය.

> "මෙම ණයවර ලිපිය ආසියානු සංවර්ධන බැංකුවෙහි ණය අංක 1414 එස්ආර්අයි (එස්එෆ්) යටතේ ආරම්භ කර ඇති අතර මෙය ක්‍රියාත්මක වනුයේ ආසියානු සංවර්ධන බැංකුව සිය බැඳුම්කර ලිපිය උපදෙස් දෙන /සහතික කරන බැංකුවට නිකුත් කළහොත් හා නිකුත් කළ විට පමණි. ගෙවීම් සඳහා මෙකී බැඳුම්කර ලිපියෙහි ඇතුළත් උපදෙස් කරුණාකර පිළිපදිනු මැනවි."

ණයවර ලිපියෙහි ඉහත සඳහන් වගන්තිය ඇතුළත් නොවූ විට පවා ගණුදෙනුව මූල්‍යකරණය කිරීමට ඔබ විසින් භාරගන්නේ නම් එය වහා ක්‍රියාත්මක තත්ත්වයට පත්වේ. කෙසේ වුවද, ආ. සං. බැ. වෙහි බැඳුම්කරය නිකුත් කළහොත් හා නිකුත් කළ විට මූල්‍යමය බැඳීම ආ.සං. බැ. වෙත පැවරෙනු ඇත. මෙවැනි අවස්ථාවක ණයවර ලිපියෙහි පහත සඳහන් වගන්තිය ඇතුළත් විය යුතුය.

> "මෙම ණයවර ලිපිය මූල්‍යකරණය ශ්‍රී ලංකාවෙහි කොළඹ, මහජන බැංකුවේ, ජාත්‍යන්තර අංශය විසින් භාරගනු ලැබ ඇත. කෙසේ වුවද, මෙය ආසියානු සංවර්ධන බැංකුවෙහි ණය අංක 1414 එස්ආර්අයි (එස්එෆ්) යටතේ විවෘත කර ඇති අතර උපදෙස් දෙන/ සහතික කරන බැංකුවට ආසියානු සංවර්ධන බැංකුව විසින් බැඳුම්කර ලිපිය නිකුත් කළහොත් හා නිකුත් කළ විට එකී ණයවර ලිපිය සම්බන්ධයෙන් මෙකී බැඳුම්කර ලිපියෙහි ඇතුළත් උපදෙස් අනුව ක්‍රියාකොට ආසියානු සංවර්ධන බැංකුවෙන් ගෙවීම / ප්‍රතිපූරණය සඳහා හිමිකම් පෑ යුතුය."

ඔබගේ ණයවර ලිපියෙහි පිටපත් දෙකක් අදාළ ක්‍රියාත්මක කිරීමේ ආයතනය වෙත යැවිය යුතු වන අතර එම ආයතනය විසින් ආ. සං. බැ. නිකුත් කරනු ලබන සාමාන්‍ය බැඳුම්කර ලිපිය ඔබගේ නියෝජිතයා වෙත යැවීමට කටයුතු සලසනු ඇත. ක්‍රියාත්මක කිරීමේ ආයතනයෙහි ඉල්ලීමට ආ. සං. බැ. එකඟ වුවහොත් ආ. සං. බැ. විසින් මෙම ලිපියෙහි ඇමුණුම් 1හි සඳහන් අන්දමට සිය සාමාන්‍ය බැඳුම්කර ලිපිය නම් කර ඇති වාණිජ බැංකුව වෙත නිකුත් කරනු ඇත.

3. (i) ණයවර ලිපියෙහි පහත දැක්වෙන කිනම් සංශෝධනයක් සඳහා වුවද ආ. සං. බැ. හි ලිඛිත අනුමැතිය අවශ්‍ය වේ.

(අ) ණයවර ලිපියෙහි වටිනාකම හා අදාල ව්‍යවහාර මුදල් ඒකකය ඇතුළු ගෙවීම් කොන්දේසි;
(ආ) භාණ්ඩ ප්‍රමාණය හෝ ඒවායේ විස්තරය;
(ඇ) ප්‍රතිලාභියා;
(ඈ) ආරම්භක රට; සහ
(ඉ) ණය ගිණුමෙන් මුදල් ආපසු ගැනීම් සඳහා අවසාන දිනය එනම් ; 2000 දෙසැම්බර් 31 වැනි දිනය, ඉක්මවා ණයවර ලිපියෙහි දිනය දීර්ඝ කිරීම.

ඉහත සඳහන් (අ) සිට (ඉ) දක්වා ඇතුලත් නොවන සංශෝධන සඳහා ආ. සං. බැ. හි අනුමැතිය අවශ්‍ය නොවේ. ඉහත සඳහන් සංශෝධනයන්ට අනුමැතිය ලබා ගැනීම සඳහා ක්‍රියාත්මක කිරීමේ ආයතනය විසින් මෙම ලිපියෙහි ඇමුණුම් 2හි දැක්වෙන ආකෘතිය මගින් ඔබ විසින් අත්සන් කරන ලද සංශෝධනයෙහි පිටපතක්ද සහිතව නොපමාව ඉල්ලුම් කළ යුතුය. මෙවැනි අවස්ථාවන්හිදී ණයවර ලිපියක සංශෝධනයන්හි පහත සඳහන් කොන්දේසිය ඇතුළත් විය යුතුය.

** මෙම සංශෝධනය බලාත්මක වනුයේ ආ. සං. බැ. හි අනුමැතිය ලැබුණු විට පමණි.**

ආ. සං. බැ. විසින් අනුමැතිය දෙනු ලැබුවහොත් එය මෙම ලිපියෙහි ඇමුණුම් 3හි දැක්වෙන ආකෘතිය මගින් ඔබගේ නියෝජිතයා වෙත මෙන්ම ක්‍රියාත්මක කිරීමේ ආයතනය වෙත දන්වනු ඇත.

(ii) කල් ඉකුත් වන දිනය සහ නැව් ගත කිරීමේ දිනය, ණය ගිණුමින් මුදල් ගැනීමේ අවසන් දිනය දක්වා දීර්ඝ කිරීම සඳහා ආ. සං. බැ. හි පූර්ව අනුමැතිය අවශ්‍ය නොවේ. එවැනි කාලය දීර්ඝ කිරීම කරන ලද අවස්ථාවන්හිදී ක්‍රියාත්මක කිරීමේ ආයතනය විසින් මෙම ලිපියෙහි ඇමුණුම් 2හි දැක්වෙන ආකෘතිය මගින් ඔබ විසින් නිසි පරිදි අත්සන් කරන ලද පිටපතක් ද සමග ආ. සං. බැ. වෙත නොපමාව දැනුම් දිය යුතුය. ආ. සං. බැ. හි පූර්ව අනුමැතියට යටත් වන හා නොවන සෑම සංශෝධනයකම පිටපත් දෙකක් ඔබ විසින් ක්‍රියාත්මක කිරීමේ ආයතනය වෙත යැවිය යුතු අතර ක්‍රියාත්මක කිරීමේ ආයතනය විසින් ආ.සං. බැ. හි අනුමැතිය අවශ්‍ය පරිදි ලබාදීම සඳහා කටයුතු යොදනු ඇත.

4. ආ. සං. බැ. මගින් බැඳීම් ලිපියක් නිකුත් කරන ලද ණයවර ලිපියක වගන්ති ප්‍රකාර ප්‍රතිලාභියෙකු වෙත ගෙවීමක් කරනු ලබන විට ඔබ නියෝජිතයා විසින් ඔබ වෙත අදාළ ලියකියවිලි ඉදිරිපත් කළ යුතු අතර සහ මෙම ලිපියෙහි ඇමුණුම් 4 හි දැක්වෙන ආකෘතිය මගින් ආ. සං. බැ. වෙත ප්‍රතිපූරණය සඳහා ඉල්ලුම් කළ යුතුය. ඔබ නියෝජිතයා විසින් ප්‍රතිපූරණය සඳහා වන ඉල්ලුම් පතෙහි පිටපතක් ක්‍රියාත්මක කිරීමේ ආයතනය වෙතද ඉදිරිපත් කළ යුතුය. මුදා හැරීමේ කටයුතු නොපමාව සිදු කිරීම පහසු කිරීම සඳහා ඔබ නියෝජිතයා මෙම ලිපියෙහි ඇමුණුම් 5හි දැක්වෙන ආකෘතිය මගින් අනුමැතිය නහවුරු කරන ස්විප්ට්, ටෙලෙක්ස් හෝ කේබල් පනිවුඩයක් මගින් ඉල්ලුම් කළ හැකිය. ඔබ නියෝජිතයා වෙත ආ. සං. බැ. වෙන් ප්‍රතිපූරණය කරනු ලැබූබව හැකිතාක් ඉක්මනින් ඔබ වෙත දැන්වීමට හැකිවන පරිදි ඔබ විසින් කටයුතු සැලැස්විය යුතු වන අතර ඔබ නියෝජිතයා වෙත ආ. සං. බැ. වෙන් ප්‍රතිපූරණය කරනු ලැබූ බව ඔබ සැහීමට පත්වන තෙක් ඔබ නියෝජිතය ගේ නාවික ලියකියවිලි ඔබ භාරයේ රඳවා ගත යුතුය. ලියකියවිලි නිදහස් කරන අවස්ථාවේදී ක්‍රියාත්මක කිරීමේ ආයතනයෙන් ප්‍රතිපාර්ශවිය අරමුදල් අය නොකළ යුතුය.

5. නැව්ගත කිරීමේ ලියකියවිලිවල හා ණයවර ලිපියෙහි කොන්දේසි අතර යම් වෙනස්කමක්/ වෙනස්කම් පවතින විට ආ. සං. බැ. ට ගෙවීම සඳහා වන හිමිකම්පෑම් ගරුකළ නොහැකි වන අතර වාණිජ බැංකුව, (ගණුදෙනු කරන) විසින් නිකුත් කළ හෝ පිටසන් කළ හාණිපූර්ණ ලිපියක් පිළිගැනීමට ද හැකි නොවේ. මෙවැනි අවස්ථාවලදී ගණුදෙනු කරන වාණිජ බැංකුව විසින් ඔබ මාර්ගයෙන් එවැනි වෙනස්කම් තිබුනද ගෙවීම සඳහා අනුමැතිය අදාල ක්‍රියාත්මක කිරීමේ ආයතනය වෙතින් ලබා ගැනීමට කටයුතු කළ යුතුය.

ඔබ සමග සාකච්ඡා කිරීමෙන් අනතුරුව ගෙවීම සඳහා අනුමැතිය දුන් පසු ක්‍රියාත්මක කිරීමේ ආයතනය විසින් අසමානතාවය හා ගණුදෙනු කරන බැංකුව වෙත ගෙවීම් සඳහා අනුමැතිය ලබා දීම පිළිබඳව කේබල් පණිවුඩයක් මගින් ආ. සං. බැ. වෙත දැන්විය යුතුය.

6. ආ. සං. බැ. විසින් එ. ජ. ඩොලර් නොවන වෙනත් මුල්‍ය ඒකකයකින් බැඳීමක් නිකුත් කළ විට එවැනි බැඳීමක් යටතේ ගෙවීම සඳහා එ. ජ. ඩොලර් නොවන මුල්‍ය ඒකකය ලබාගත හැකි වේ යයි ආ. සං. බැ. බලාපොරොත්තු වන විනිමය අනුපාතිකය පදනම මත තීරණය කරන ලද එ. ජ. ඩොලර් සමාන ප්‍රමාණය බැඳීම් ලිපියෙහි සඳහන් කරනු ඇත. එ. ජ. ඩොලර් නොවන වෙනත් මුල්‍ය ඒකකයකින් ගෙවීමක් සඳහා ඔබගේ ඕනෑම නියෝජිතයකු විසින් එවැනි හිමිකම්පෑමක් කළ අවස්ථාවකදී, එ. ජ. ඩොලර් සමාන ප්‍රමාණය ආ. සං. බැ. හි බැඳීම යටතේ ලබාගත හැකි ප්‍රමාණය ඉක්ම වන්නේ නම් ආ. සං. බැ. එ.ජ. ඩොලර් නොවන මුදල් ඒකකයෙන් වූ සමාන ප්‍රමාණය බැඳීම යටතේ ලබාගත හැකි එ. ජ. ඩොලර් ප්‍රමාණයට සීමා කරනු ඇත. මෙම හේතුව නිසා හෝ වෙනයම් හේතුවක් නිසා ඔබගේ ණයවර ලිපියෙහි වගන්ති ප්‍රකාර කරනු ලබන හිමිකම් පෑමක් සඳහා සම්පූර්ණ වශයෙන් හෝ කොටසක් වශයෙන් හෝ ඔබ නියෝජිතයා ප්‍රතිපූරණය කිරීම ආ.සං.බැ. ප්‍රතික්ෂේප කළහොත් ආ. සං. බැ. විසින් අනුමත නොකරන ලද ප්‍රමාණය ඔබ විසින් ඔබ නියෝජිතයාට ගෙවිය යුතුය. මෙම කරුණ සම්බන්ධයෙන් ඔබ විසින් ක්‍රියාත්මක කිරීමේ ආයතනය සමග අවශ්‍ය විධිවිධාන සලසා ගත යුතුය.

7. මේ සම්බන්ධයෙන් වන විනිමය පාලන අවශ්‍යතාවයන් පිළිබඳව විනිමය පාලක විසින් ඔබට උපදෙස් දෙනු ඇත.

8. ඔබගේ සියළුම අය කිරීම් ක්‍රියාත්මක කිරීමේ ආයතනයේ ගිණුමට හර විය යුතුය.

ඔබේ විශ්වාසී,

**එම්. බී. දිසානායක.**
ප්‍රධාන ගණකාධිකාරී.

පිටපත්;-

1. විනිමය පාලක
2. සාමාන්‍යාධිකාරී,
   ලංකා විදුලි බල මණ්ඩලය
   සර් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත,
   තැ. පෙ. 540.
   කොළඹ 02.
3. සීමාසහිත ලංකා විදුලි බල (පුද්ගලික) සමාගම,
   අංක 411, ඊ. එච්. කුරේ ගොඩනැගිල්ල, තෙවන මහළ,
   ගාලු පාර,
   කොළඹ 03.

# වාණිජ බැංකුවලින් විදේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු මිළදී ගැනීම සඳහා මහ බැංකුවේ විනිමය අනුපාතිකයන් 1996

(ශ්‍රී ලංකා රුපියල්)

| ක්‍රියාත්මක වන දිනය | වක්‍රලේඛ අංකය | ඕස්ට්‍රේලියානු ඩොලර් (ඩොලර් 01) | ඔස්ට්‍රියානු ෂිලිං (ෂිලිං 10) | බහරේන් ඩිනාර් (ඩිනාර් 01) | බෙල්ජියානු ප්‍රෑන්ක් (ප්‍රෑන්ක් 10) | කැනේඩියානු ඩොලර් (ඩොලර් 01) | ඩෙනිෂ් ක්‍රෝනර් (ක්‍රෝ. 10) | ඩොයිෂ් මාර්ක් (ඩො. මා. 01) | ෆින්ලන්ත මාර්ක්කා (මාර්ක්කා 10) | ප්‍රංශ ප්‍රෑන්ක් (ප්‍ර. ප්‍රෑන්ක් 10) | හොංකොං ඩොලර් (ඩොලර් 10) | ඉතාලි ලීරා (ලීරා 1000) | ජපාන යෙන් (යෙන් 100) | කුවේට් ඩිනාර් (ඩිනාර් 01) | මැලේසියානු රින්ගිට් (රින්ගිට් 01) | නෙදර්ලන්ත ගිල්ඩර් (ගිල් 01) | නෝර්වීජියානු ක්‍රෝනර් (ක්‍රෝ 10) | ඕමාන් රියාල් (රියාල් 01) | සවුදි අරාබියානු රියාල් (රියාල් 01) | සිංගප්පූරු ඩොලර් (ඩොලර් 01) | ස්වීඩන් ක්‍රෝනර් (ක්‍රෝ 10) | ස්විස් ප්‍රෑන්ක් (ප්‍රෑන්ක් 01) | එක්සත් අරාබි එමීර් ඩිරාම් (ඩිරාම් 01) | එ. රා. පවුම් (පවුම් 01) | ඇ. එ. ජ. ඩොලර් (ඩොලර් 01) |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 02.01.96 | 4158 | 38.90 | 51.80 | 138.55 | 17.70 | 38.30 | 93.80 | 36.45 | 116.60 | 106.45 | 67.55 | 32.95 | 50.50 | 169.70 | 20.55 | 32.45 | 82.10 | 132.05 | 13.95 | 36.95 | 78.15 | 45.25 | 14.20 | 81.00 | 52.70 |
| 09.01.96 | 4160 | 39.00 | 51.45 | 138.60 | 17.60 | 38.50 | 93.60 | 36.20 | 116.60 | 105.70 | 67.55 | 33.05 | 49.50 | 169.80 | 20.45 | 32.35 | 82.05 | 132.10 | 13.95 | 36.70 | 78.65 | 44.90 | 14.25 | 80.90 | 52.75 |
| 17.01.96 | 4162 | 38.85 | 51.45 | 138.75 | 17.50 | 38.40 | 93.05 | 35.90 | 116.40 | 105.10 | 67.65 | 33.25 | 49.50 | 169.95 | 20.40 | 32.10 | 82.05 | 132.25 | 13.95 | 36.70 | 79.20 | 44.70 | 14.25 | 80.70 | 52.80 |
| 23.01.96 | 4164 | 38.50 | 50.40 | 138.95 | 17.20 | 38.35 | 91.50 | 35.30 | 113.60 | 103.45 | 67.75 | 33.05 | 49.50 | 170.20 | 20.50 | 31.55 | 80.85 | 132.40 | 13.95 | 36.80 | 77.75 | 43.80 | 14.25 | 78.85 | 52.85 |
| 30.01.96 | 4166 | 38.65 | 50.10 | 138.95 | 17.10 | 37.90 | 90.85 | 35.15 | 111.25 | 102.10 | 67.75 | 32.65 | 49.00 | 169.85 | 20.50 | 31.35 | 80.25 | 132.40 | 13.95 | 36.95 | 75.35 | 43.30 | 14.25 | 78.75 | 52.85 |
| 13.02.96 | 4168 | 39.55 | 50.55 | 138.90 | 17.25 | 38.20 | 91.60 | 35.45 | 110.45 | 103.15 | 67.70 | 33.45 | 48.95 | 170.20 | 20.55 | 31.65 | 81.20 | 132.35 | 13.95 | 36.95 | 75.10 | 43.35 | 14.25 | 79.95 | 52.85 |
| 20.02.96 | 4170 | 39.50 | 50.80 | 138.80 | 17.35 | 37.90 | 92.15 | 36.05 | 111.10 | 104.60 | 67.65 | 33.05 | 49.80 | 170.10 | 20.45 | 31.85 | 81.65 | 132.25 | 13.95 | 37.35 | 75.35 | 44.40 | 14.25 | 80.90 | 52.80 |
| 27.02.96 | 4172 | 39.65 | 51.10 | 138.80 | 17.55 | 38.00 | 93.45 | 36.10 | 112.40 | 105.15 | 67.65 | 33.55 | 49.90 | 170.60 | 20.50 | 32.55 | 82.70 | 132.25 | 13.95 | 37.15 | 77.95 | 44.50 | 14.25 | 80.50 | 52.80 |
| 06.03.96 | 4174 | 39.70 | 50.55 | 138.75 | 17.20 | 38.20 | 91.70 | 35.35 | 111.80 | 103.20 | 67.65 | 33.75 | 49.60 | 170.20 | 20.55 | 31.60 | 81.35 | 132.20 | 13.95 | 37.00 | 76.85 | 43.45 | 14.25 | 79.85 | 52.80 |
| 12.03.96 | 4176 | 40.15 | 50.30 | 138.75 | 17.20 | 38.25 | 91.05 | 35.15 | 110.65 | 102.70 | 67.65 | 33.50 | 48.35 | 170.20 | 20.55 | 31.60 | 80.90 | 132.25 | 13.95 | 37.10 | 76.40 | 43.45 | 14.25 | 79.65 | 52.80 |
| 19.03.96 | 4178 | 40.50 | 50.75 | 138.85 | 17.30 | 38.40 | 91.95 | 35.55 | 110.25 | 103.75 | 67.70 | 33.40 | 49.40 | 170.40 | 20.60 | 31.75 | 81.65 | 132.30 | 13.95 | 37.20 | 77.55 | 44.10 | 14.25 | 79.95 | 52.80 |
| 26.03.96 | 4180 | 40.55 | 50.25 | 138.75 | 17.25 | 38.40 | 91.85 | 35.45 | 110.55 | 103.45 | 67.65 | 33.45 | 49.10 | 170.30 | 20.55 | 31.70 | 81.55 | 132.20 | 13.95 | 37.10 | 78.95 | 43.85 | 14.25 | 80.25 | 52.80 |
| 02.04.96 | 4182 | 41.00 | 50.40 | 138.80 | 17.20 | 38.55 | 91.55 | 35.35 | 109.90 | 103.75 | 67.65 | 33.35 | 48.70 | 170.40 | 20.65 | 31.60 | 81.40 | 132.30 | 13.95 | 37.15 | 78.25 | 43.85 | 14.25 | 79.80 | 52.80 |
| 09.04.96 | 4184 | 41.00 | 50.25 | 138.80 | 17.15 | 38.55 | 91.40 | 35.30 | 109.90 | 103.55 | 67.65 | 33.45 | 48.65 | 170.00 | 20.65 | 31.55 | 81.50 | 132.25 | 13.95 | 37.20 | 78.65 | 43.85 | 14.25 | 79.95 | 52.80 |
| 16.04.96 | 4186 | 41.50 | 49.60 | 138.95 | 16.90 | 38.60 | 89.90 | 34.65 | 108.60 | 102.25 | 67.70 | 33.35 | 48.15 | 169.75 | 20.85 | 31.05 | 80.45 | 132.40 | 13.95 | 37.05 | 77.70 | 42.55 | 14.25 | 78.95 | 52.85 |
| 23.04.96 | 4188 | 41.10 | 49.65 | 138.95 | 16.80 | 38.50 | 89.50 | 34.50 | 107.85 | 101.95 | 67.70 | 33.40 | 48.85 | 169.75 | 21.05 | 30.85 | 80.10 | 132.40 | 13.95 | 37.15 | 77.90 | 42.60 | 14.25 | 79.20 | 52.85 |
| 07.05.96 | 4191 | 41.80 | 48.55 | 139.05 | 16.65 | 38.40 | 88.90 | 34.40 | 106.05 | 101.75 | 67.75 | 33.50 | 49.90 | 169.85 | 21.00 | 30.65 | 79.75 | 132.50 | 14.00 | 37.35 | 76.25 | 42.25 | 14.25 | 78.95 | 52.90 |
| 14.05.96 | 4193 | 42.05 | 49.10 | 139.15 | 16.70 | 38.20 | 88.90 | 34.35 | 108.50 | 101.35 | 67.80 | 33.65 | 49.80 | 170.00 | 21.05 | 30.70 | 79.85 | 132.60 | 14.00 | 37.35 | 77.25 | 42.05 | 14.30 | 79.80 | 52.95 |
| 21.05.96 | 4195 | 42.05 | 48.75 | 139.55 | 16.65 | 38.40 | 88.85 | 34.25 | 108.70 | 101.20 | 68.00 | 33.95 | 49.15 | 170.45 | 21.15 | 30.65 | 79.90 | 132.95 | 14.05 | 37.35 | 77.95 | 41.60 | 14.30 | 79.50 | 53.10 |
| 28.05.96 | 4196 | 41.65 | 48.50 | 139.75 | 16.60 | 38.35 | 88.60 | 34.15 | 107.95 | 100.90 | 68.10 | 33.75 | 48.95 | 170.75 | 21.15 | 30.50 | 79.90 | 133.20 | 14.05 | 37.35 | 77.10 | 41.60 | 14.35 | 79.65 | 53.20 |
| 04.06.96 | 4198 | 42.35 | 48.90 | 140.10 | 16.75 | 38.55 | 89.80 | 34.65 | 108.40 | 102.35 | 68.25 | 34.15 | 48.80 | 171.15 | 21.15 | 30.80 | 81.10 | 133.50 | 14.10 | 37.50 | 78.60 | 42.25 | 14.40 | 81.95 | 53.30 |
| 11.06.96 | 4200 | 41.95 | 49.20 | 140.55 | 16.75 | 38.85 | 89.30 | 34.45 | 109.70 | 101.80 | 68.45 | 34.20 | 48.45 | 171.85 | 21.20 | 30.80 | 80.65 | 133.95 | 14.15 | 37.60 | 78.40 | 41.75 | 14.45 | 81.45 | 53.50 |
| 18.06.96 | 4202 | 42.05 | 49.65 | 140.95 | 16.95 | 38.90 | 90.40 | 34.90 | 110.50 | 103.05 | 68.60 | 34.35 | 48.75 | 172.15 | 21.30 | 31.15 | 81.30 | 134.30 | 14.15 | 37.70 | 79.45 | 42.35 | 14.45 | 81.65 | 53.60 |
| 25.06.96 | 4204 | 42.00 | 49.55 | 141.30 | 16.90 | 39.05 | 90.40 | 34.85 | 111.75 | 102.70 | 68.85 | 34.55 | 49.00 | 172.65 | 21.35 | 31.40 | 81.40 | 134.65 | 14.20 | 37.80 | 80.00 | 42.20 | 14.50 | 82.00 | 53.75 |
| 02.07.96 | 4206 | 42.05 | 49.85 | 141.70 | 17.05 | 39.15 | 91.00 | 35.05 | 111.90 | 103.65 | 69.00 | 34.85 | 48.65 | 173.25 | 21.45 | 31.45 | 82.15 | 135.00 | 14.25 | 37.85 | 80.40 | 42.60 | 14.55 | 82.95 | 53.90 |
| 09.07.96 | 4208 | 42.60 | 49.90 | 142.20 | 17.05 | 39.15 | 91.10 | 35.05 | 111.95 | 103.65 | 69.25 | 35.00 | 48.20 | 173.90 | 21.50 | 31.25 | 82.35 | 135.50 | 14.30 | 37.90 | 80.45 | 42.40 | 14.60 | 83.30 | 54.10 |
| 16.07.96 | 4210 | 42.75 | 50.25 | 142.40 | 17.10 | 39.20 | 91.50 | 35.25 | 112.35 | 104.15 | 69.35 | 35.00 | 48.50 | 174.15 | 21.55 | 31.40 | 82.50 | 135.70 | 14.30 | 37.85 | 80.05 | 42.65 | 14.60 | 83.20 | 54.20 |
| 23.07.96 | 4212 | 42.50 | 51.15 | 142.45 | 17.45 | 39.30 | 93.25 | 36.00 | 115.40 | 106.35 | 69.40 | 35.35 | 49.85 | 174.25 | 21.55 | 32.10 | 83.55 | 135.75 | 14.30 | 37.80 | 80.85 | 44.10 | 14.60 | 83.00 | 54.20 |
| 31.07.96 | 4214 | 42.30 | 51.65 | 142.50 | 17.65 | 39.05 | 94.20 | 36.35 | 115.60 | 107.20 | 69.45 | 35.40 | 49.65 | 174.65 | 21.55 | 32.35 | 84.40 | 135.80 | 14.30 | 37.95 | 82.10 | 44.55 | 14.65 | 83.65 | 54.20 |
| 06.08.96 | 4216 | 41.55 | 51.60 | 142.55 | 17.65 | 39.10 | 94.20 | 36.40 | 116.50 | 107.15 | 69.45 | 35.45 | 50.25 | 174.95 | 21.55 | 32.45 | 84.30 | 135.85 | 14.35 | 37.95 | 81.60 | 44.85 | 14.65 | 82.95 | 54.25 |
| 13.08.96 | 4218 | 41.85 | 51.85 | 142.85 | 17.70 | 39.30 | 94.30 | 36.50 | 117.35 | 106.65 | 69.60 | 35.50 | 49.85 | 175.30 | 21.60 | 32.50 | 84.35 | 136.10 | 14.35 | 38.05 | 81.10 | 44.80 | 14.65 | 83.55 | 54.35 |
| 20.08.96 | 4220 | 42.30 | 51.80 | 143.20 | 17.55 | 39.30 | 93.50 | 36.15 | 117.50 | 105.80 | 69.80 | 35.55 | 50.00 | 175.50 | 21.65 | 32.20 | 83.75 | 136.45 | 14.40 | 38.30 | 81.35 | 44.70 | 14.70 | 83.60 | 54.50 |
| 27.08.96 | 4222 | 42.75 | 51.55 | 143.30 | 17.75 | 39.40 | 94.65 | 36.55 | 116.25 | 107.00 | 69.85 | 35.65 | 50.00 | 175.60 | 21.65 | 32.60 | 84.50 | 136.55 | 14.40 | 38.35 | 82.40 | 45.35 | 14.70 | 84.10 | 54.50 |
| 03.09.96 | 4224 | 42.70 | 51.80 | 143.45 | 17.70 | 39.55 | 94.70 | 36.50 | 117.90 | 106.65 | 69.95 | 35.80 | 49.70 | 175.85 | 21.70 | 32.55 | 84.35 | 136.70 | 14.40 | 38.40 | 81.80 | 45.00 | 14.75 | 84.40 | 54.60 |
| 10.09.96 | 4227 | 43.45 | 51.85 | 143.75 | 17.65 | 39.45 | 94.15 | 36.30 | 117.15 | 106.30 | 70.10 | 35.85 | 49.60 | 176.20 | 21.70 | 32.40 | 84.60 | 137.00 | 14.45 | 38.50 | 81.45 | 44.50 | 14.75 | 84.50 | 54.70 |
| 17.09.96 | 4229 | 43.00 | 51.05 | 144.10 | 17.45 | 39.65 | 93.20 | 35.90 | 115.20 | 105.45 | 70.25 | 35.55 | 49.15 | 176.15 | 21.75 | 32.05 | 83.80 | 137.30 | 14.50 | 38.55 | 81.50 | 43.75 | 14.80 | 84.50 | 54.85 |
| 24.09.96 | 4231 | 43.05 | 50.95 | 144.30 | 17.40 | 39.80 | 93.30 | 35.85 | 116.70 | 106.00 | 70.35 | 35.70 | 49.50 | 176.45 | 21.75 | 32.10 | 83.95 | 137.50 | 14.50 | 38.60 | 82.25 | 43.90 | 14.80 | 84.60 | 54.90 |
| 01.10.96 | 4233 | 43.15 | 50.85 | 144.50 | 17.40 | 39.95 | 93.00 | 35.75 | 116.00 | 105.65 | 70.45 | 35.85 | 49.05 | 176.65 | 21.70 | 31.90 | 83.80 | 137.70 | 14.50 | 38.65 | 82.20 | 43.45 | 14.85 | 85.15 | 54.95 |
| 08.10.96 | 4235 | 43.05 | 50.65 | 144.75 | 17.30 | 40.30 | 92.95 | 35.65 | 116.10 | 105.25 | 70.55 | 35.85 | 48.75 | 176.95 | 21.80 | 31.75 | 83.75 | 137.90 | 14.55 | 38.65 | 82.50 | 43.40 | 14.85 | 85.40 | 55.05 |
| 15.10.96 | 4237 | 43.15 | 50.75 | 144.80 | 17.30 | 40.35 | 93.00 | 35.70 | 116.10 | 105.40 | 70.60 | 35.85 | 48.90 | 177.10 | 21.80 | 31.80 | 83.85 | 138.00 | 14.55 | 38.70 | 82.50 | 43.55 | 14.85 | 86.20 | 55.10 |
| 22.10.96 | 4239 | 43.50 | 50.40 | 145.05 | 17.20 | 40.50 | 92.70 | 35.45 | 115.30 | 105.00 | 70.70 | 35.60 | 48.50 | 177.40 | 21.80 | 31.60 | 83.80 | 138.20 | 14.60 | 38.65 | 82.35 | 43.00 | 14.90 | 86.95 | 55.20 |
| 29.10.96 | 4241 | 43.30 | 50.95 | 145.05 | 17.40 | 40.65 | 93.60 | 35.90 | 116.25 | 106.25 | 70.70 | 35.95 | 48.10 | 177.45 | 21.80 | 32.00 | 84.85 | 138.20 | 14.60 | 38.60 | 82.90 | 43.30 | 14.90 | 87.85 | 55.20 |
| 05.11.96 | 4243 | 43.05 | 51.00 | 145.90 | 17.55 | 40.95 | 93.90 | 36.05 | 116.70 | 106.70 | 70.65 | 36.00 | 48.25 | 177.30 | 21.60 | 32.15 | 85.65 | 138.05 | 14.55 | 38.80 | 83.05 | 43.05 | 14.85 | 89.30 | 55.10 |
| 12.11.96 | 4245 | 43.00 | 51.00 | 144.80 | 17.55 | 40.95 | 94.45 | 36.30 | 116.50 | 107.35 | 70.60 | 36.00 | 48.95 | 177.50 | 21.70 | 32.40 | 86.50 | 138.00 | 14.55 | 38.95 | 82.85 | 43.20 | 14.85 | 90.00 | 55.10 |
| 19.11.96 | 4247 | 43.20 | 51.45 | 144.80 | 17.55 | 40.70 | 94.35 | 36.20 | 117.15 | 107.10 | 70.60 | 36.00 | 49.10 | 177.45 | 21.65 | 32.25 | 86.25 | 137.95 | 14.55 | 39.00 | 82.45 | 42.70 | 14.85 | 90.85 | 55.10 |
| 26.11.96 | 4249 | 44.35 | 51.65 | 144.75 | 17.50 | 40.70 | 93.95 | 36.05 | 117.30 | 106.35 | 70.55 | 36.35 | 48.85 | 178.00 | 21.65 | 32.10 | 85.60 | 137.95 | 14.55 | 38.95 | 82.10 | 42.70 | 14.85 | 91.60 | 55.05 |
| 03.12.96 | 4251 | 44.70 | 50.65 | 145.00 | 17.25 | 40.45 | 92.75 | 35.55 | 115.55 | 104.70 | 70.70 | 36.10 | 48.00 | 178.35 | 21.65 | 31.65 | 85.15 | 138.20 | 14.55 | 38.95 | 81.35 | 41.85 | 14.90 | 92.10 | 55.15 |
| 10.12.96 | 4253 | 43.65 | 50.60 | 145.10 | 17.15 | 40.25 | 92.20 | 35.35 | 114.15 | 104.60 | 70.75 | 35.90 | 48.40 | 178.45 | 21.70 | 31.50 | 84.50 | 138.25 | 14.60 | 39.05 | 80.25 | 41.50 | 14.90 | 89.95 | 55.20 |
| 17.12.96 | 4255 | 43.35 | 50.45 | 145.20 | 17.05 | 40.15 | 91.90 | 35.20 | 114.80 | 104.35 | 70.75 | 35.90 | 48.10 | 178.55 | 21.65 | 31.40 | 84.20 | 138.35 | 14.60 | 39.10 | 80.00 | 41.35 | 14.90 | 90.75 | 55.25 |
| 26.12.96 | 4257 | 43.55 | 50.00 | 145.20 | 17.10 | 40.00 | 92.25 | 35.25 | 114.75 | 104.40 | 70.75 | 35.85 | 47.90 | 178.60 | 21.65 | 31.45 | 84.85 | 138.40 | 14.60 | 39.10 | 80.10 | 41.05 | 14.90 | 91.40 | 55.25 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව